# 2014

# වාර්ෂික වාර්තාව

# அண்டறிக்கை

# ANNUAL REPORT



National Film Corporation of Sri Lanka
Ministry of Parliamentary Reforms & Mass Media

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

இலங்கைத் தேசியத் திரைப்படக் கூட்டுத்தாபனம்
பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சு

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

# වාර්ෂික වාර්තාව

# 2014

# පටුන


| | පිටුව |
|---|---|
| පිළිගැන්වීම | 01 |
| පාලන වාර්තාව | 02 - 24 |
| ශේෂ පත්‍රවල ලාභාලාභ ගිණුම් ආශ්‍රිත සටහන් | 25 - 62 |
| විගණකාධිපති වාර්තාව | 63 - 76 |

# පිළිගැන්වීම

දිනය ඃ 2016.03.04 මගේ අංකය ඃ එන්එෆ්සි/103/05/02/96

පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය
ගයන්ත කරුණාතිලක මැතිතුමා
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
අංක.163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ,
කොළඹ 05.

ගරු ඇමතිතුමනි,

<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව - වාර්ෂික වාර්තාව 2014</u>

1980 අංක 45 දරණ පනතින් සංශෝධිත 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාර 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා පහත සඳහන් ලේඛනයන් ද සමඟ සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

1. 2014 වසරේ සංස්ථාව විසින් කරන ලද කාර්යයන් හා අදාල ප්‍රකාශ
2. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා සංස්ථාවේ ලාභාලාභ ගිණුම්, ආශ්‍රිත සටහන් හා එදිනට ශේෂ පත්‍රය
3. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණකාධිපති වාර්තාව

මෙයට - විශ්වාසී වූ ,

නීතිඥ දීපාල් චන්ද්‍රරත්න
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

<u>පාලන වාර්තාව</u>


01. හැඳින්වීම

02. අධ්‍යක්ෂ මණ්ඩලය

03. දේශිය චිත්‍රපට නිෂ්පාදනය

04. පිරිස් හා ආයතන පාලනය

05. චිත්‍රපට ප්‍රචාරනය/සිනේ ඇඩ්ස්

06. චිත්‍රපට ප්‍රදර්ශනය

07. අභ්‍යන්තර විගණන කටයුතු

08. සිනමා සංස්කෘතිය හා අධ්‍යාපන කටයුතු

09. දේශිය සැපයුම් - ආනයනය හා අපනයනය

10. චිත්‍රපට ගබඩාව

11. නෛතික කටයුතු

12. මූල්‍ය කටයුතු

13. චිත්‍රාගාරය

14. පරික්ෂණ කටයුතු

15. සුභසාධනය

16. ආගමික කටයුතු

17. වෛද්‍ය සහනාධාර ක්‍රමය

18. වෘත්තීය සමිති

19. ස්තුතිය

## 01. හැඳින්වීම

1980 අංක 45 දරණ පනතින් සංශෝධනය කල 1971 අංක 47 දරණ ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32 (1) වගන්තිය සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය යටතේ ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2014 වර්ෂය පිළිබඳ වාර්තාව

2014 වර්ෂය පිළිබඳ ඉදිරිපත් කරන මෙම වාර්තාව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 43 වන ක්‍රියාත්මක වර්ෂයට අදාල වේ.

## 02. අධ්‍යක්ෂ මණ්ඩලය

2014 වර්ෂය තුල ජාතික චිත්‍රපට සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය පහත නම් සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විතව ඇත.

1. නීතිඥ අශෝක සේරසිංහ මහතා - සභාපති
2. නීතිඥ ඩී.කරුණාතිලක මහතා - ක්‍රියාකාරි අධ්‍යක්ෂ
3. මහාචාර්ය ආරියරත්න ඇතුගල - අ.ම.සාමාජික (නිලබලයෙන්)
4. නීතිඥ සමන්ත වැලිවේරිය මහතා - අ.ම.සාමාජික (නිලබලයෙන්)
5. විජිත කණුගල මහතා - අ.ම.සාමාජික (නිලබලයෙන්)
6. මහාචාර්ය රෝලන්ඩ් අබේපාල - අ.ම.සාමාජික
7. ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර - අ.ම.සාමාජික
8. ආචාර්ය ඩී.වෙන්කටේෂ්වරන් - අ.ම.සාමාජික
9. රේණුකා බාලසූරිය මිය - අ.ම.සාමාජික
10. ජේ.සී.වැලිගමගේ මිය - භාණ්ඩාගාර නියෝජිත
11. නීතිඥ ඩබ්.කේ.වික්‍රමආරච්චි මිය - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

නීතිඥ අශෝක සේරසිංහ මහතා, ජාතික චිත්‍රපට සංස්ථා සභාපති ධූරයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් 2014.11.17 වන දින සිට ජයන්ත ධර්මදාස මහතා සභාපති ධූරයට පත්කර ඇත.

නීතිඥ ඩී.කරුණාතිලක මහතා, ජාතික චිත්‍රපට සංස්ථා ක්‍රියාකාරි අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත්වීම හේතුවෙන් 2014.09.10 වන දිනසිට එච්.ඒ.රණසිංහ මහතා එකී තනතුරට පත්කර ඇත.

රේණුකා බාලසූරිය මහත්මිය හා ආචාර්යය ඩී.වෙන්කටේෂ්වරන් ගේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්ව ධූර කාලය අවසන් වීමෙන් පසු 2014 ජුලි මස සිට තිස්ස ලියනසූරිය මහතා හා වී.වාමදේවන් මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වයට පත්කර ඇත.

## 03. <u>දේශිය චිත්‍රපට නිෂ්පාදනය</u>

### 3.1. දේශිය චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කිරීම.

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව 2014 වර්ෂය සඳහා ලියාපදිංචි කරන ලද චිත්‍රපට සංඛ්‍යාව 40 කි.

එක් චිත්‍රපටයක් ලියාපදිංචි කිරීම සඳහා රු.2,000/- ක මුදලක් සංස්ථාව නිෂ්පාදකගෙන් අයකර ගනු ලැබේ.

### 3.2 දේශිය චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබාදෙනු ලබන ණය පහසුකම්

#### 3.2.1 චිත්‍රාගාර සේවා ණය පහසුකම්

අනුමත චිත්‍රාගාර සේවා ණය පහසුකමේ වටිනාකම රු.400,000/- කි. මෙම වසර තුල චිත්‍රාගාර සේවා ණය පහසුකම් කිසිදු චිත්‍රපට නිෂ්පාදකවරයෙකු හෝ ඉල්ලුම් කර නැත.

#### 3.2.2 චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය පහසුකම් ලබාදීම

මෙම වර්ෂය තුල චිත්‍රපට නිෂ්පාදනය සඳහා නිෂ්පාදන ණය පහසුකමක් ඉල්ලුම් කර ඇත.

**<u>සැ.යුතුයි ඃ-</u>**

පහත සඳහන් ණය පහසුකම් ලබාදෙනු ලබන්නේ, ණය ඉල්ලුම් කරනු ලබන චිත්‍රපටය දේශිය චිත්‍රපට වර්ගීකරණ කමිටුව වෙත අදාල චිත්‍රපටයේ තිර පිටපත ඉදිරිපත් කිරීමෙන් අනතුරුය ලබාදෙනු ලබන කමිටු නිර්දේශය චිත්‍රපට සංවර්ධන අරමුදල් පාලන මණ්ඩලයට ඉදිරිපත් කිරිමෙන් පසු, පාලක මණ්ඩල අදහස වුයේ, චිත්‍රපටය නිෂ්පාදනය අදියරේ ණය ලබානොදි චිත්‍රපටයේ පළමු පිටපත නිෂ්පාදනය කිරිමෙන් පසු ණය ලබාදීම සලකා බලන බවයි.

3.2.3 **විශේෂ ණය පහසුකම්**

මෙම වර්ෂය තුල කිසිදු විශේෂ ණය පහසුකමක් ලබා දී නොමැත.

3.2.4 **පිටපත් මුද්‍රණය සඳහා ණය පහසුකම් ලබාදීම**

මෙම වර්ෂය තුල චිත්‍රපට සඳහා කිසිදු පිටපත් මුද්‍රණය ණය පහසුකමක් ලබා දී නැත.

සංස්ථා (රිත්මා) මණ්ඩලය මඟින් තිරගත කරන ලද "පරපුර" චිත්‍රපටය සඳහා රු.මි.02 ක ණය මුදලක් ලබා දී ඇත.

3.2.5 **ප්‍රචාරක ණය පහසුකම් ලබාදීම**

මෙම වර්ෂය තුල චිත්‍රපට සඳහා ප්‍රචාරක ණය පහසුකමක් ලබා දී නොමැත.

3.2.6 **උපශීර්ෂ පාඨ ණය පහසුකම් ලබාදීම**

මෙම වර්ෂය තුල කිසිදු චිත්‍රපටයක් සඳහා උපශීර්ෂ පාඨ ණය පහසුකමක් ලබා දී නොමැත.

3.3 **කාර්මික ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ කාර්මික හැඳුනුම්පත් නිකුත් කිරීම**

මෙම වසර තුල කිසිදු කාර්මික ශිල්පියෙකු ලියාපදිංචි කර නොමැති අතර, නව හැඳුනුම්පත් නිකුත් කිරීමක් හෝ නිකුත් කරන ලද හැඳුනුම්පත් වෙනුවට නැවත නිකුත් කිරීම් හෝ සිදුකර නොමැත.

3.4 **දේශිය චිත්‍රපට නිෂ්පාදනය සඳහා විදේශිය නළු, නිළි, කාර්මික ශිල්පීන් යොදා ගැනීම වෙනුවෙන් අනුමත ගාස්තු අයකිරීම**

මෙම වසර තුල දේශිය චිත්‍රපට වෙනුවෙන් යොදා ගන්නා ලද විදේශිය නළු, නිළි, කාර්මික ශිල්පීන් වෙනුවෙන් අයකිරීමක් සිදුකර නොමැත.

3.5 **දේශිය වෘතාන්ත /වෙළඳ වාර්තා වැඩසටහන් රූගත කිරීම සඳහා කැමරා උපකරණ ලබාගැනීම අනුමත කිරීම වෙනුවෙන් කරනු ලබන අයකිරීම**

වෘතාන්ත චිත්‍රපට 01 ක් හා විදේශිය වෙළඳ වැඩසටහන් 01 ක් වෙනුවෙන් අදාල කටයුතු කර ඇත.

3.6 **සුවිශේෂී කලාකරුවන් ඇගැයීම**

උක්ත වර්ෂයේ කලාකරුවන් දෙදෙනකු වෙනුවෙන් මුල්‍ය පරිත්‍යාග සිදුකර ඇත.

- සුනිල් සෝම පීරිස් මහතාට රු.100,000/-
- තිලක් වේහැල්ල මහතාට රු.25,000/-

3.7 **දේශීය / විදේශීය සිනමා උළෙලවල් පැවැත්වීම**

- ඉරාන චිත්‍රපට උළෙල 2014.02.09 සිට 2014.02.12 දක්වා
- ප්‍රංශ චිත්‍රපට උළෙල 2014.03.28 සිට 2014.03.31 දක්වා
- බංග්ලාදේශ චිත්‍රපට උළෙල 2014.04.24 සිට 2014.04.27 දක්වා
- සාක් සංස්කෘතික මධ්‍යස්ථානය විසින් සාක් චිත්‍රපට උළෙල 2014.05.20 සිට 2014.05.30 දක්වා
- රුසියානු චිත්‍රපට උළෙල 2014.05.28 සිට 2014.05.30 දක්වා
- පාකිස්ථාන චිත්‍රපට උළෙල 2014.06.13 සිට 2014.06.15 දක්වා
- මාලිනී ෆොන්සේකා චිත්‍රපට උළෙල 2014.10.20 සිට 2014.10.25 දක්වා
- යුරෝපීය සංගමය විසින් පවත්වනු ලබන සිනමා උළෙල 2014.11.27 සිට 2014.11.08
- කොළඹ ජාත්‍යයන්තර චිත්‍රපට උළෙල 2014.10.02 සිට 2014.10.07 දක්වා

3.8 **චිත්‍රපට ආනයනය**

2014 වර්ෂය සඳහා චිත්‍රපට ආනයනය වෙනුවෙන් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වූ ආනයනයකරුවන්ගේ සංඛ්‍යාව 32 කි.

ඒ අනුව, 2014 වර්ෂය තුල චිත්‍රපට ආනයනය කිරීම වෙනුවෙන් ප්‍රදර්ශන මණ්ඩල 05 හරහා අනුමැතිය ලබාදුන් චිත්‍රපට සංඛ්‍යාව පහතින් දැක් වේ.

- දෙමළ චිත්‍රපට - 52
- හින්දි චිත්‍රපට - 15
- ඉංග්‍රිසි චිත්‍රපට - 37

**3.9 චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ සංස්ථා භාරය**

**3.9.1 විශ්‍රාම වැටුප් ගෙවීම: (විශ්‍රාම වැටුප් ගෙවීම එක් අයකුට රු.2,000/- බැගින්)**

- ජනවාරි - මාර්තු (විශ්‍රාමිකයන් 63 දෙනෙකු වෙනුවෙන්) රු.378,000.00
- අප්‍රේල් - ජූනි (විශ්‍රාමිකයන් 63 දෙනෙකු වෙනුවෙන්) රු.378,000.00
- ජූලි - සැප්තැම්බර් (විශ්‍රාමිකයන් 63 දෙනෙකු වෙනුවෙන්) රු.378,000.00
- ඔක්තොම්බර්-නොවැම්බර් (විශ්‍රාමිකයන් 63 දෙනෙකු වෙනුවෙන්) රු.252,000.00
- දෙසැම්බර් (විශ්‍රාමිකයන් 62 දෙනෙකු වෙනුවෙන්) රු.126,000.00

3.9.2 **2014 වසර තුළ මියගිය විශ්‍රාමලාභීන් :**

- තිලක් කරුණාරත්න මහතාට රු.10,000/- ක මරණාධාර මුදල් ගෙවා ඇත.
- විශ්‍රාම වැටුප්ලාභී නොයෙල් විතානගේ මහතා මියගොස් ඇත. (රංගන ශිල්පී)

**3.10 ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල**

**3.10.1 විදේශීය වෘතාන්ත/වාර්තා/වෙළඳ වැඩ සටහන් රූගත කිරීම සඳහා අවසර ලබාදීම.**

- වෘතාන්ත චිත්‍රපට 04 ක්, වාර්තා චිත්‍රපට 31 ක් සහ වෙළඳ වැඩ සටහන් 08 ක් වෙනුවෙන් අනුමත ගාස්තුව අයකර ගෙන ඇත.

## 04. පිරිස් හා ආයතන පාලනය

**4.1 කාර්ය මණ්ඩලය**

| | | | |
|---|---|---|---|
| 2014.01.01 දිනට සේවක සංඛ්‍යාව | - | | 137 |
| 2014 වර්ෂය තුල බඳවාගත් සංඛ්‍යාව | - | | 13 |
| | | | 150 |

**2014 වර්ෂය තුල ඉවත් වූ සංඛ්‍යාව**

| | | | |
|---|---|---|---|
| විශ්‍රාම ලැබූ සංඛ්‍යාව | - | 02 | |
| සේවයෙන් ඉල්ලා අස් වූ සංඛ්‍යාව | - | 06 | |
| තනතුර අතහැර යාම | - | 01 | |
| සේවයෙන් පහ කිරීම් | - | 01 | 10 |
| ස්ථිර කාර්ය මණ්ඩලය | - | | 140 |
| සභාපති | - | 01 | |
| ක්‍රියාකාරි අධ්‍යක්ෂ | - | 01 | |
| දෛනික දීමනා | - | 01 | 03 |
| 2014.12.31 දිනට මුළු සේවකයන් | - | | 143 |

## 4.2 ආයතන පාලනය හා සේවක අවශ්‍යතා ඉටු කිරීම.

ආයතනයේ සේවක පාලනයට අදාලව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයමින් සේවා කටයුතු ඉටු කර ඇත.

# 05. චිත්‍රපට ප්‍රචාරණය / සිනේ ඇඩ්

## 5.1 වසර තුල ඉටුකල කාර්යයන්

- දේශිය සිනමාවේ 67 වන සැමරුම සහ චිත්‍රපට සංස්ථා 42 වන සංවත්සරය වෙනුවෙන් මාධ්‍ය ප්‍රචාරන කටයුතු

- දැයට කිරුළ අධ්‍යාපන හා සංස්කෘතික ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රදර්ශන චිත්‍රපට කිහිපයක පූර්ව ප්‍රචාරක පට ප්‍රදර්ශනය කිරීම.

- සිනමා සංස්කෘතික අංශය ආරම්භ කල සිනමා ඩිප්ලෝමා පාඨමාලාව 2013/2014 මාධ්‍ය අනුග්‍රහ කටයුතු

- නව සිනමාශාලා ලෙස ආරම්භ කල සෙල්වම් - චෙන්කලඩි, ස්කයි ලයිට් - මාතර පිළිබඳ මාධ්‍ය මඟින් ප්‍රචාරනයක් ලබා දීම.

- ජාතික ලේඛනාගාර දෙපාර්තමේන්තුවේ ආරම්භ කල චිත්‍රපට සංරක්ෂණාගාරය පිළිබඳ පුළුල් ප්‍රචාරනයක් මාධ්‍ය මඟින් මෙහෙයවීම.

- සිනමා සංස්කෘතික අංශය මඟින් පවත්වාගෙන යන "ජීවිතයට සිනමාව" පහත වැඩසටහන් පිළිබඳව කතිකාවතක් සහ පුළුල් ප්‍රචාරණයක් ලබාදීම.

I. "ජීවිතයට සිනමාව" - පිළිමතලාව සෞන්දර්යය ගුරු විද්‍යාලයේ වැඩසටහන

II. "ජීවිතයට සිනමාව" - කොළඹ ඉඩම් නිරවුල් කිරීම් දෙපාර්තමේන්තුවේ වැඩසටහන

III. "ජීවිතයට සිනමාව" - විරාගය සිනමා ප්‍රතිසේවය - සංස්ථාවේ පැවැති වැඩසටහන

IV. "ජීවිතයට සිනමාව" - වෘත්තිය තාක්ෂණ විද්‍යාලය - රත්මලාන පැවැති වැඩසටහන

- ඔක්තෝබර් 01 වන දිනට යෙදී තිබූ ලෝක ළමා දිනය වෙනුවෙන් ප්‍රදර්ශනය කල "Fly Away Home" චිත්‍රපටය පිළිබඳ පුළුල් ප්‍රචාරනයක් ලබාදීම.

- රෝගාබාධයන්ට ලක්ව සිටින සුනිල් සෝම පීරිස් , තිලක් වේහැල්ල යන කලාකරුවන් සඳහා ප්‍රදානය කල මුදල් පරිත්‍යාග පිළිබඳ ප්‍රචාරනයක් ලබාදීම.

- "සැමීගේ කථාව, "වරිග පොජ්ජ, "පරපුර, "කල්පාන්තයේ සිහිනයක්, සතියකට මට රට භාරදෙන්න යන චිත්‍රපට වල ප්‍රදර්ශනය ආරම්භයේ සිට අවසානය දක්වා මුද්‍රිත මාධ්‍ය ප්‍රචාරක කටයුතු

## 06. චිත්‍රපට ප්‍රදර්ශනය

### 6.1 චිත්‍රපට ප්‍රදර්ශනය

- 2014 වර්ෂය තුලදි රිත්මා මණ්ඩලය යටතේ සිනමාශාලා 65 ක් ක්‍රියාත්මක විය.

- අලුතින් ඉදිකරන ලද නිව් ලයින් - දඹුල්ල, සෙල්ලම් ප්‍රීමියර් - චෙන්කලඩි, ස්කයිලයිට් - මාතර, තරංගනී - දැරණියගල, රජරට - මැදවච්චිය යන සිනමාශාලා 2014 වර්ෂයේ චිත්‍රපට ප්‍රදර්ශන කටයුතු ආරම්භ කර ඇත.

### 6.2 චිත්‍රපට මුදාහැරීම

- රිත්මා මණ්ඩලයේ සිනමාශාලා 65 ක් සහ අනෙකුත් මණ්ඩලවල සිනමාශාලා සඳහා චිත්‍රපට මුදාහැර ඇත.
- 2014 වර්ෂය තුළ රිත්මා මණ්ඩලය හා අනෙකුත් මණ්ඩල සමඟ ඒකාබද්ධ වී චිත්‍රපට මුදාහැරීමට කටයුතු කර ඇත.
- රිත්මා මණ්ඩලය මඟින් සිංහල චිත්‍රපට 04 ක් මුදාහැරීමට කටයුතු කර ඇත.
- මෙම වර්ෂයේ ජනවාරි සිට සැපයුම්කරුවන් විසින් ආනයනය කරන ලද දෙමළ චිත්‍රපට 15 ක් රිත්මා මණ්ඩලයේ හා අනෙකුත් මණ්ඩල සිනමා ශාලාවන් හා ඒකාබද්ධ වී මුදාහැරීමට කටයුතු කර ඇත.
(සංස්ථා මණ්ඩලය වෙත ලබා දී ඇති කොටසින් (කෝටා) හා අනෙකුත් මණ්ඩල කොටස් වලින් (කෝටා) චිත්‍රපට ලබාගෙන රිත්මා මණ්ඩලය විසින් මුදාහැරීමට කටයුතු කර ඇත.)

## 6.3 චිත්‍රපට කුලිය

අප මණ්ඩලය විසින් අනෙකුත් මණ්ඩලවලට සපයන ලද චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි චිත්‍රපට කුළී මුදල් ලැබී ඇත. (2014 සැප්තැම්බර් මස දක්වා)

- ලංකා ෆිල්ම්ස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් -රු.2,634,430.29
- මූවි ප්‍රඩියුසර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් -රු.1,503,496.32
- සිනමා එන්ටර්ටේට්මන් (ප්‍රයිවට්) ලිමිටඩ් -රු.6,295,225.32
- ඊ.ඒ.පී.ෆිල්ම්ස් ඇන්ඩ් තියටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 453,826.89

අප මණ්ඩලයේ අනෙකුත් මණ්ඩල වලින් ලබාගත් චිත්‍රපට සඳහා පහත සඳහන් පරිදි මුදල් ගෙවා ඇත. (2014 සැප්තැම්බර් මස දක්වා)

- ලංකා ෆිල්ම්ස් ඩිස්ට්‍රිබියුටර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 210,910.08
- මූවි ප්‍රඩියුසර්ස් ඇන්ඩ් ඉම්පෝටර්ස් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් -රු. 6,036,017.53
- සිනමා එන්ටර්ටේට්මන් (ප්‍රයිවට්) ලිමිටඩ් -රු.23,615,008.26
- ඊ.ඒ.පී.ෆිල්ම්ස් ඇන්ඩ් තියටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් -රු.27,573,045.64

- රිපෝ තැන්පතු

2014 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා රු.15,500,000.00 ක තැන්පතු ඇත. 2014 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා කොමිස් මුදල පහත සඳහන් පරිදි වේ.

රු.14,176,994,47

- 2014 වර්ෂය තුල විවිධ සමිති සමාගම් හා විශ්ව විද්‍යාල හා පාසැල් සිසුන් සඳහා සහන මිලක් යටතේ ආධාර ලබා ගැනීම සඳහා චිත්‍රපට ලබාදීම.

- පොලිස් අභ්‍යාස විද්‍යාලය සඳහා හා හමුදා කඳවුරු සඳහා සහන මිලකට චිත්‍රපට ලබා දීම.

## 07. අභ්‍යන්තර විගණන කටයුතු

අභ්‍යන්තර විගණන කටයුතු 1971 අංක 38 දරණ මුදල් පනතේ විධි විධාන වලට අනුකූලව හා විගණකාධිපතිගේ අවධානයට යටත්ව සිදුකර ඇත.

වර්ෂය තුල ක්‍රියාත්මක විගණන හා කළමනාකරණ කමිටුව පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

| | | |
|---|---|---|
| ජේ.සී.වැලිගමගේ මිය | - | කමිටු සභාපති |
| ඩබ්.ශ්‍රියානි හංවැල්ල මිය | - | කමිටු ලේකම් |
| මහාචාර්ය රෝලන්ඩ් අබේපාල | - | කමිටු සාමාජික |
| ආචාර්ය ප්‍රණිත් අබේසුන්දර | - | කමිටු සාමාජික |
| කේ.සී.පී.සේනාරත්න මිය | - | අධීක්ෂණ නිලධාරි |

## 08. සිනමා සංස්කෘතික හා අධ්‍යාපන කටයුතු

### 8.1 අධ්‍යාපන වැඩසටහන්

- සිනමාකරණ ඩිප්ලෝමා පාඨමාලාව 2013/2014 පාඨමාලාව ආරම්භ කිරීම හා 2012 ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කළ ඩිප්ලොමාධාරින් 21 දෙනෙකු සඳහා සහතික පත්‍ර ප්‍රදානය කිරීම 2014.03.15 දින සිදුකර ඇත.

### 8.2 සිනමා ප්‍රකාශන එළිදැක්වීම

- චිත්‍රපට සගරාව ජනවාරි අප්‍රේල් කලාපය, මැයි අගෝස්තු කලාපය හා සැප්තැම්බර් දෙසැම්බර් කලාපය එළි දැක්වීම
- BAW ජයමාන්න සිනමා මෙහෙයුම් ග්‍රන්ථය එළිදැක්වීම

### 8.3 ජීවිතයට සිනමාව සිනමා රසවින්දන වැඩසටහන්/වැඩමුළු

- 2014.07.25 දින ගිරාගම සෞන්දර්යය ගුරු විදුහල - පිළිමතලාව
- 2014.07.31 දින ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව - කොළඹ
- 2014.10.01 දින ලෝක ළමා දිනය කේන්ද්‍ර කර කොළඹ පාසල් සිසුන් කේන්ද්‍රකර NFC සිනමා ශාලාවේදි පැවැත් විය.
- 2014.10.16 දින වෘත්තිය තාක්ෂණ විශ්ව විද්‍යාලය - රත්මලාන
- 2014.12.02 දින ඇසල සත්සර කොළඹ විශ්ව විද්‍යාලය (ශාස්ත්‍ර පීඨය) - කොළඹ

## 8.4 කෙටි චිත්‍රපට නිර්මාණ තරඟය

- 2014 නොවැම්බර් මස 11 දින උළෙල පැවැත් විය. වාර්තා හා කෙටි චිත්‍රපට ලෙස අංශ දෙකකින් තරඟ පැවැත් වූ අතර එහිදි අවසන් වටය සඳහා තරඟකරුවන් 34 ක් තේරි පත් විය. කෙටි චිත්‍රපට අංශයේ පළමු, දෙවන, හා තෙවන ස්ථාන සඳහා මුදලින් රු.75,000.00 ක් ද වාර්තා අංශයෙන් ජයග්‍රාහකයා සඳහා මුදලින් රු.20,000.00 ද පිරිනැමුණු අතර ත්‍යාග හා සහතික පත් ප්‍රදානය පහත පරිදි සිදු කරන ලදි.

| | |
|---|---|
| රන් සම්මාන | - 05 |
| රිදී සම්මාන | - 03 |
| ලෝකඩ සම්මාන | - 01 |
| සහතික පත්‍ර | - 37 |

## 8.5 සිනමා කතිකාව

- විරාගය චිත්‍රපටය ප්‍රතිසේවනය නමින් 2014 දින වැඩසටහනක් සිදුකර ඇත. එහි ප්‍රධාන දේශකයන් ලෙස මහාචාර්ය සමන්ත හේරත් (කොළඹ විශ්ව විද්‍යාලයේ සිංහල අංශය) හා ප්‍රවීණ රංගන ශිල්පී සනත් ගුණතිලක මහතා සහභාගි විය.

## 8.6 අධ්‍යාපනික චිත්‍රපට ප්‍රදර්ශනය

- 2014.03.08 - විද්‍යාලංකාර ඉංග්‍රිසි විද්‍යාලය කේන්ද්‍රකර ගනිමින් චිත්‍රපට ප්‍රදර්ශනය හා පොත් ප්‍රදර්ශන කුටිය
- 2014.04.03, 04 සහ 05 - ශාන්ත අන්තෝනි විද්‍යාලය - මහනුවර කේන්ද්‍ර කර ගනිමින් ත්‍රපට ප්‍රදර්ශනය හා පොත් ප්‍රදර්ශන කුටිය
- 2014.05.06, 07, 08 සහ 09 ජාතික පුස්තකාලය හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - අධ්‍යාපනික චිත්‍රපට ප්‍රදර්ශනය හා පොත් ප්‍රදර්ශන කුටිය
- 2014.05.17 බෞද්ධ චිත්‍රපට ප්‍රදර්ශනය සංස්ථා පරිශ්‍රය (වෙසක් උළෙල දින)
- 2014.07.31 ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව - කොළඹ
- 2014.08.12 ශ්‍රී ලංකා පොලීසිය අපරාධ වාර්තා කොට්ඨාශය - චිත්‍රපට ප්‍රදර්ශනය
- 2014.08.19 සංස්ථා සිනමා ශාලාව (Butterfly චිත්‍රපටය)
- 2014.09.28 ගෝනගල සුභසාධක සමිතිය - මාකවිට ප්‍රදර්ශනය

### 8.7 දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය

- දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශන කුටිය (2014.03.21 සිට 2014.03.28) - කුලියාපිටිය

## 09. දේශිය සැපයුම් ආනයනය හා අපනයනය

- සිනමාශාලා හිමියන් සහ සංස්ථාවේ අවශ්‍යතාවයන් පරිදි කාර්මික උපකරණ හා කාර්යාලීය උපකරණ හා ලිපිද්‍රව්‍ය හා සේවා නියමිත ක්‍රමවේදය යටතේ සැපයීම.

- අදාල නියෝජිත ආයතන සමඟ භාණ්ඩ හා සේවාවන්ට අදාල සේවා ගිවිසුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.

## 10. චිත්‍රපට ගබඩාව

### 10.1 කාර්ය භාරය

- චිත්‍රපට සංස්ථාවේ අවසරය මත ආනයනය කරනු ලබන විදේශ චිත්‍රපට හා දේශීයව නිෂ්පාදනය කරනු ලබන චිත්‍රපට භාරගෙන ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම.

- එම චිත්‍රපට භාරගෙන තත්ත්ව පරික්ෂා කර රැගුම් පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම හා එහි අනුමැතිය පරිදි නැවත තත්ත්ව වාර්තා ලබාගෙන ආනයනයකරු / නිෂ්පාදක බෙදාහැරීම් මණ්ඩලයට භාරදීම හෝ සිනමාශාලා වෙත බෙදා හැරීම.

- සංස්ථා මණ්ඩලය මගින් අනුපෙළ ගන්වනු ලබන චිත්‍රපට නියමිත සිනමාශාලා වෙත දුම්රියෙන් සහ අතින් චිත්‍රපට යැවීම හා නිසි පරිදි ගෙන්වා ගැනීම.

- එම චිත්‍රපට වලට අදාල පූර්ව ප්‍රචාරක ද්‍රව්‍ය සිනමාශාලා වෙත කල්වේලා ඇතිව යැවීම.

- චිත්‍රපට ගබඩාව වෙත ලැබෙන සියලුම චිත්‍රපට නැවත පරික්ෂා කොට රාක්කගත කිරීම.

- රාක්ක ගතකර ඇති චිත්‍රපට වරින් වර පරික්ෂා කිරීම.

- තත්ත්ව පරික්ෂා කිරීමෙන් ලබා ගැනීමෙන් උපයා ඇති මුදල ලක්ෂ 12 ක් පමණ වේ.

- චිත්‍රපට ගබඩාවේ ඇති පැරණි චිත්‍රපට ප්‍රතිසංස්කරණය කර නැවත ප්‍රදර්ශනයට සුදුසු ආකාරයෙන් සකස් කිරීම හා සංස්ථාව වෙත ආදායමක් උපයා දීම.

- පැරණි චිත්‍රපට වලින් ධාවනයට සුදුසු චිත්‍රපට පිටපත් 03 ක් පමණක් ගබඩාවේ රඳවා ඉතිරි වන සියලු චිත්‍රපට අයිතිකරුවන් වෙත භාරදීම මඟින් චිත්‍රපට ගබඩාවේ නඩත්තු කටයුතු ක්‍රමවත්ව සිදුකිරීම.

- චිත්‍රපට ගබඩාවේ ගොඩගසා ඇති ගිවිසුම් කාලය අවසන් වු චිත්‍රපට හා අබලන් චිත්‍රපට අයිතිකරුවන් වෙත දන්වා යැවීමෙන් පසු පිලිස්සීමට කටයුතු කොට එහිදි ඉතිරිවන අළු අලෙවි කර සංස්ථාව වෙත ආදායමක් ලබා ගැනීම.

- සිංහල, දෙමළ, ඉංග්‍රිසි හා හින්දි චිත්‍රපට 66 ක් ලියාපදිංචි කර ඇත.

- අධි ලේඛනාගාරයේ තැම්පත්කර ඇති සිංහල චිත්‍රපට තත්ත්ව පරික්ෂා කිරීමට කටයුතු කිරීම.

## 11. <u>නෛතික කටයුතු</u>

### 11.1 කාර්ය භාරය

- සංස්ථාව පාර්ශවයක් වන නඩු සම්බන්ධයෙන් සංස්ථාව වෙනුවෙන් පෙරකලාසි ගොනු කිරීම හා අදාල අධිකරණයේ සංස්ථාව වෙනුවෙන් පෙනී සිටිම.

- කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරියේ කම්කරු ආරවුල් සඳහා සංස්ථාව වෙනුවෙන් පෙනී සිටිම.

- ජාතික චිත්‍රපට සංස්ථාව විසින් නිෂ්පාදනය කරනු ලබන චිත්‍රපට, චිත්‍රපට බෙදාහැරීම සම්බන්ධයෙන් සහ චිත්‍රපට නිෂ්පාදනය / චිත්‍රාගාර සේවා /

පිටපත් මුද්‍රණය / උපශීර්ෂ පාඨ යෙදීම / ප්‍රචාරක කටයුතු සඳහා ණය මුදල් ලබාදීම සහ සේවා සැපයීමේ සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම සහ අත්සන් තැබීම.

- ජාතික චිත්‍රපට සංස්ථාවට උපකාරක සේවා ලබාගැනීම, භාණ්ඩ මිලදී ගැනීම, ගොඩනැගිලි ඉදිරිකිරීම් සහ වෙනත් කටයුතු සම්බන්ධයෙන් සියලුම නීත්‍යානුකූල ගිවිසුම් සකස් කිරීම හා අත්සන් තැබීම.

- ජාතික චිත්‍රපට සංස්ථා පනත සංශෝධනය කිරීමේ කටයුතු සම්බන්ධයෙන් පියවර ගැනීම.

- සංස්ථාවේ අභ්‍යන්තර සේවකයින් සම්බන්ධයෙන් සිදුකරන විනය පරීක්ෂණ කටයුතු

- එදිනෙදා අවශ්‍යතාවය පරිදි සංස්ථාවේ ඕනෑම අංශයකින් යොමුකරන නීතිමය ගැටලු සඳහා උපදෙස් ලබාදීම.

## 11.2 2014 වර්ෂය තුල ක්‍රියාත්මක වෙමින් පැවති හා පවතින නඩු පිළිබඳ විස්තර

1. අභියාචනාධිකරණ නඩු අංක : 590/2007
2. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DMR 1897/11
3. අභියාචනාධිකරණ නඩු අංක : 870/99
4. කොළඹ දිසා අධිකරණ නඩු අංක : DSP 18/2012
5. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක : 97659/5/11
6. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක : SC(FR) 475/2012
7. දිසා අධිකරණ නඩු අංක : DMR 1126/2012 – සිනේ සිටි සිනමාශාලා 4 න් සංස්ථාවට ගෙවිය යුතු සංස්ථා භාරය නොගෙවීම සම්බන්ධයෙන් සංස්ථාව විසින් නඩු පවරන ලදි.
8. දිසා අධිකරණ නඩු අංක : DMR 2576/2012 – "උඩුගංයාමය" චිත්‍රපටය නිෂ්පාදනය සඳහා සංස්ථාවෙන් ලබාගත් ණය මුදල් නොගෙවීම සම්බන්ධයෙන් චිත්‍රපටයේ නිෂ්පාදකට එරෙහිව සංස්ථාව විසින් නඩු පවරන

ලදි. එම නඩුව අමාත්‍යාංශ ලේකම්ගේ ලිඛිත උපදෙස් පරිදි ඉල්ලා අස්කරගෙන ඇත.

9. කොළඹ වාණිජ මහාධිකරණ නඩු අංකඃ 42/2012/අයිපී "මවුස්" නැමැති සිංහල චිත්‍රපටය වෙනුවෙන් ආයෝජනය කරන ලද එ.ජ.ඩොලර් 135,000/- ක මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් ඊශ්‍රායෙල් ජාතිකයින් තිදෙනෙකු විසින් සංස්ථාව පාර්ශවයක් කර මෙම නඩුව පවරා ඇත.

10. කොළඹ දිසා අධිකරණ නඩු අංකඃ DSP/00026/2013, DSP/00027/2013, DSP/00028/2013, DSP/00029/2013, DSP/00030/2013 බෙදාහැරීමේ ක්‍රියා පිළිවෙත සම්බන්ධයෙන් සංස්ථා සභාපති විසින් නිකුත් කරන ලද 2012.12.13 දින අංකඃ NFC/100/01/040 දරණ ලිපිය මඟින් කර ඇති නියෝගයේ (චිත්‍රපට පිටපත් සංඛ්‍යාව 35 ට සීමා කිරීම) සඳහන් කරුණු ක්‍රියාත්මක කිරීම වලක්වමින් ආචාර්ය සෝමරත්න දිසානායක ඇතුළු පැමිණිලිකරුවන් 05 දෙනෙකු විසින් වාරණ නියෝගයක් ලබා ගෙන ඇත.

11. අභියාචනාධිකරණ පෙත්සම් අංකඃ CA(Writ) Application No:144/2013 මුදා හැරීමට අනුමත චිත්‍රපට පිටපත් සංඛ්‍යාව 35 ක් වු සීමාව ඉක්මවා චිත්‍රපට පිටපත් මුදාහැරීම සඳහා අනුමැතිය ලබාදීමට විරුද්ධව සී/ස ලාංකීක සිනමා ශිල්පීන්ගේ සංධානය සහ චිත්‍රපට අධ්‍යක්ෂවරුන්ගේ සංසදය විසින් මෙම පෙත්සම ගොනුකර ඇත.

12. කම්කරු විනිශ්චය සභා නඩු අංකඃ 13/41/2013 තම සේවය අසාධාරණ හා අයුක්ති සහගත ලෙස අවසන් කරන ලද බැවින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා ප්‍රදීප් ලංකා ධර්මවික්‍රම මහතා විසින් මෙම නඩුව පවරා ඇත.

13. දිසා අධිකරණ නඩු අංක : 2146/13 ඩී.එම්.ආර් අරුමෝසම් වැහි චිත්‍රපටය සඳහා සංස්ථාවෙන් ලබා දී ඇති ණය මුදල් සහ එයට අදාල නෛතික පොලිය අයකර ගැනීම සඳහා සංස්ථාව විසින් චිත්‍රපටයේ නිෂ්පාදකට විරුද්ධව නඩු පවරන ලදි. එම නඩුව ද අමාත්‍යාංශ ලේකම්ගේ ලිඛිත උපදෙස් පරිදි ඉල්ලා අස්කරගෙන ඇත.

14. කම්කරු විනිශ්චය සභා නඩු අංක : 2/435/2014

තම සේවය අසාධාරණ හා අයුක්ති සහගත ලෙස අවසන් කරන ලද බැවින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සමුද්‍රා සුභසිංහ මහත්මිය විසින් මෙම නඩුව පවරා ඇත.

15. කම්කරු විනිශ්චය සභා නඩු අංක : 1/47/2014

තම සේවය අසාධාරණ හා අයුක්ති සහගත ලෙස අවසන් කරන ලද බැවින් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා ඉනෝකා කුමාරි ද සිල්වා මහත්මිය විසින් මෙම නඩුව පවරා ඇත.

16. DMR2603/2013 වලාපටල - චිත්‍රපටය නිෂ්පාදනය සඳහා සංස්ථාවෙන් ලබාගත් ණය මුදල් නොගෙවීම සම්බන්ධයෙන් චිත්‍රපටයේ නිෂ්පාදකට එරෙහිව සංස්ථාව විසින් නඩු පවරන ලදි.

17. DSP 00048/2014-2014.03.19 දින නිෂ්ප්‍රභා කර ඇත.

18. CHC 370/2014 – සුභා චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීමේදි නිෂ්පාදක හට සංස්ථාව විසින් අසාධාරණයක් සිදු වු බවට ප්‍රකාශ කරමින් මෙම නඩුව පවරා ඇත.

**11.3 කම්කරු දෙපාර්තමේන්තුවේ පැවැති පරික්ෂණ**

I හිටපු සංස්ථා සේවක - ඩබ්.එස්.ෆොන්සේකා මහතා ඇතුලු පිරිස

II කම්කරු කාර්යාලය පැමිණිලි අංකය : IR/15/19/2012 – සංස්ථා සේවක සමිත දිසානායක මහතා

III කම්කරු කාර්යාලය පැමිණිලි අංකය : IR/15/20/2012 – කේ.ජී.ඩී.බන්දුසේන මහතා

IV කම්කරු කාර්යාලය පැමිණිලි අංකය : CCC/කා.ආ/719/2012 – ටි.එස්.ප්‍රසන්න පීරිස් මහතා

## 12. <u>මූල්‍ය කටයුතු</u>

12.1

| | 2014 | 2013 |
|---|---|---|
| ප්‍රදර්ශනයෙන් ලත් ආදායම | 28,337,822 | 35,278,807 |
| සිනමා කාබන් | 2,496,080 | 1,764,268 |
| ලිපි ද්‍රව්‍ය | 1,185,398 | 1,606,207 |
| අමතර කොටස් | 5,507,545 | 356,118 |
| සිනේ ඇඩ්ස් | 364,188 | 300,308 |
| චිත්‍රාගාරය | 1,481,969 | 2,269,993 |
| ශුද්ධ ලාභය | 36,807,353 | 11,622,173 |

12.2 2014 වර්ෂයේ විකුණුම් ආදායම රු.මිලියන 39.6 කි. එය 2013 වර්ෂයේ රු.මිලියන 41.5 ක් වු අතර, 2013 ට වඩා 2014 දී විකුණුම් ආදායම රු.මිලියන 2 කින් අඩු වී ඇත.

12.2.1 මෙම වර්ෂයේ ගිය වර්ෂයට වඩා සමස්ථ වියදම රු.මිලියන 13.8 ක් අඩු වී ඇත. එයට ප්‍රධාන හේතුව බොල් ණය සඳහා හානිකරන ගැලපීම අඩුවෙන් සිදු කිරීම වේ.

වර්ෂය තුල භාණ්ඩාගාරයෙන් පුනරාවර්ථන වියදම සඳහා රු.මිලියන 75 ක් ලැබී ඇත. වර්ෂයේ ශුද්ධ ලාභය රු.මිලියන 36.8 කි. පසුගිය වර්ෂයේ ශුද්ධ ලාභය රු.මිලියන 11.6 කි.

12.2.2 භාණ්ඩාගාරයෙන් අනුමත ප්‍රාග්ධන මුදල් වලින් වර්ෂයේ ප්‍රාග්ධන වියදම වශයෙන් ලැබී ඇත්තේ, රු.මිලියන 18.1 ක් පමණි.

**12.3 නිෂ්පාදන ණය සහ සිනමාහල් ණය**

චිත්‍රපට ප්‍රදර්ශනයේ දි පිටපත් ප්‍රචාරක කටයුතු සඳහා සිනමා නවීකරණ සඳහා ණය පහසුකම් මෙම වර්ෂයේ දි ලබා දී ඇත.

**12.4 ආයෝජන**

වර්ෂය අවසානයේ ස්ථාවර තැන්පතු වල රු.මිලියන 16 ක් ද, භාණ්ඩාගාර බිල්පත්වල රු.මිලියන 81 ක් සහ රිපෝ තැන්පතු වල රු.මිලියන 84 ක් අයෝජනය කර තිබේ. මෙම මුදල් වලින් රු.මිලියන 34 ක් සංස්ථාවේ සේවක මහත්ම මහත්මින්ගේ පාරිතෝෂිත මුදල් සඳහා වන අතර සිනමාහල් වලින් ලබාගන්නා ඇප මුදල් රු.මිලියන 2.4 ක් ද ඉහත සඳහන් මුදල් වල ඇතුලත් වේ.

**12.5 සේවක පාරිතෝෂිත මුදල් වෙන් කිරීම.**

මෙම වර්ෂයේ සේවක පාරිතෝෂික මුදල් වෙන් කිරීම මුළු ප්‍රමාණය රු.මිලියන 34 කි.

12.6 සේවක පාරිශ්‍රමික ගෙවනු ලබන්නේ භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් වලිනි. ඒ හේතුව මත වර්ෂයේ ආදායම් බදු වෙන් කිරීමක් කර නොමැත,

## 13 චිත්‍රාගාරය

පශ්චාත් නිශ්පාදන අදියරේ පවතින චිත්‍රපට සඳහා කාර්මික සේවාවන් සහ පහසුකම් සැපයීම චිත්‍රාගාරයේ ප්‍රධාන කාර්යයන් වේ.

ඒ අනුව, මෙම වසරේ චිත්‍රාගාරයේ පහත සඳහන් අංශ වලින් දේශීය නිෂ්පාදකවරුන්ට අවශ්‍ය කාර්මික සේවාවන් සහ පහසුකම් සපයා ඇත.

1. ශබ්ද අංශය (Digital)
2. ආංකිත සංස්කරණ අංශය (Digital)
3. චිත්‍රපට හා රූපවාහිනි රූපගත කිරීමේ මැදිරිය

### 13.1 ඉටු වී ඇති කාර්යයන්

1 සරසවි චිත්‍රාගාරය විසින් චිත්‍රපට කර්මාන්තයට ලබාදෙන කාර්මික පහසුකම් අනුව දේශිය චිත්‍රපට 21 ක පමණ කාර්මික සේවාවන් මෙම කාලය තුල ලබාදී ඇත.

2 චිත්‍රපට සහ රූපවාහිනි වැඩසටහන් රූගත කිරීම සඳහා වන පහසුකම් චිත්‍රාගාරයේ අභ්‍යන්තර මැදිරිය සහ චිත්‍රපට අදාල කාලය තුළ චිත්‍රපට 02 ක් ද ඇතුලුව රූපවාහිනි වැඩසටහන්, වෙළඳ දැන්වීම් 15 ක් සඳහා ද රූගත කිරීමේ පහසුකම් ලබා දී ඇත.

3 චිත්‍රාගාරයේ ශබ්ද අංශයේ එක් මැදිරියක් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව බහුමාන ශබ්ද පටිගත කිරීම සඳහා නවීකරණය කිරීම.

මෙම ව්‍යාපෘතිය සඳහා මූලික සැලසුම් අවසන් කර ඇති අතර, සභාපතිතුමා විසින් පත්කරන ලද තාක්ෂණික කමිටුව විසින් අවසන් සැලසුම් (Drawings) සකස්කර අවසන් කර ඇත.

4 චිත්‍රාගාරයේ ඩිජිටල් සංස්කරණ අංශය සඳහා නවීන තාක්ෂණානුකූල නව සංස්කරණ පද්ධතියක් මිලදී ගෙන උසස් තත්ත්වයේ වර්ණ නිවැරදි කිරීමේ (Color Correction) සහ ත්‍රිමාණ රූප නිර්මාණය කිරීමේ (Computer generated image) තාක්ෂණය වැඩි දියුණු කිරීම.

චිත්‍රපටයක් මුද්‍රණය කිරීමට පෙර වර්ණ නිවැරදි (Color Correction) කිරීම සහ පරිගණක ආශ්‍රිත රූප නිර්මාණය කිරීම (Computer generated image) මූලික කරගනිමින් දේශිය සිනමා කර්මාන්තයට අවශ්‍ය ලෙස මෙම අංශය යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා කාර්මික පිරිවිතරයන් සකස් කර අවසන් කර ඇත.

5 ශබ්දාගාරයේ B.A.W ජයමාන්න මැදිරිය බහුකාර්ය අධ්‍යයන කාමරයක් ලෙස නවීකරණය කර රූගත කිරීම, සිනමා පාඨමාලා සහ සිනමා සම්බන්ධ විශේෂ අවස්ථා සඳහා කුළියට ලබාදීමට අවශ්‍ය මූලික කටයුතු අවසන් කර ඇත.

6 ජාතික චිත්‍රපට සංරක්ෂණාගාරය ආරම්භ කිරීම සඳහා ජාතික අධිලේඛණාගාරය සමඟ සම්බන්ධ වී කටයුතු කර ඇති අතර, චිත්‍රාගාර සංරක්ෂණාගාරය සතුව තිබූ චිත්‍රපට 127 ක් අධිලේඛණාගාරයේ ජාත්‍යයන්තර ප්‍රමිතීන්ට අනුව සකස්කර ඇති ගබඩා කාමරවල තැන්පත් තර ඇති අතර, තවත් චිත්‍රපට 200 ක් පමණ 2014 වසර අවසානය වන විට තැන්පත් කිරීමට සැලසුම් කර ඇත.

## 13.2 චිත්‍රාගාරයේ පශ්චාත් කාර්මික සේවාවන් ලබාගත් චිත්‍රපට - 2014

1. Dr නවරියන්
2. ඇද්දා ලණුව දැම්මා කොඩිය
3. පටිභාන
4. බොට හොඳනම් මට මොකෝ
5. කේ සෙරා
6. ඔළුව ජපන් කඳ ජර්මන්
7. ආදර පූජාසනේ
8. ආලෝකෝ උදපාදි
9. සුපිරි අන්දරේ
10. The Rainbow
11. වෙස්වලාගත් තරුණිය
12. සතියකට රට මට භාරදෙන්න
13. කල්පාන්තය
14. සුදු සමනලී
15. දැකලා පුරුදු කෙනෙක්
16. සුළඟ අප රැගෙන යන්න
17. මගේ යාළු මාලු
18. Silence of the Court
19. Mr ජයනාථ (TV Com.)
20. වස්දඩු රාවය
21. Mr John

**සංස්කරණ අංශය**

1. Q sera Sarah
2. සතියකට රට මට භාරදෙන්න
3. වෙස්වලාගත් තරුණිය
4. සුරඟනා
5. ආදර පූජාසනේ
6. NFC (Short film festival)
7. God father
8. කුමරි කන්‍යාවී
9. ඔළුව ජපන් කඳ ජර්මන්
10. Documentary

**කළු සුදු රසායනාගාරය**

| | |
|---|---|
| 1. උතුරු කුණාටුව | 2. ගිණිගත් රාත්‍රිය |
| 3. මධුමාලි | 4. ආත්ම වර්ෂා |
| 5. සිතක වියරුව | 6. ඔබ මට වාසනා |
| 7. සසල රේඛා | 8. සතියකට රට මට භාර දෙන්න |

**චිත්‍රාගාරයේ රූගත කළ චිත්‍රපට / රූපවාහිනී වැඩසටහන් - 2014**

1. Tokyo Cement All Island School Quiz
2. Derana – Little Star – Season – 06
3. Derana – Dell Studio
4. ශ්‍රී ලංකා පදනම් ආයතනය - උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව
5. The Film – According to Mathew
6. Inflame (Pvt.) Ltd. – Magee – Advertising film let
7. Inflame (Pvt.) Ltd. – Milkmaid – Advertising film let
8. බොට හොඳනම් මට මොකෝ - චිත්‍රපටය
9. Sri Lanka Rupavahini Corporation – All Island School quiz – 2014
10. Sri Lanka Rupavahini Corporation – Muthuhara – Programme
11. Sri Lanka Rupavahini Corporation – Rin Bright Star
12. National Development Bank- Work shop – SELF Employers
13. CD Presentation – Mr.Asela Indralal
14. Educational Seminar
15. Interview with Mr. Georg Manathunga

## 14. පරීක්ෂණ කටයුතු

### 14.1 වර්ෂය තුල ඉදිකරණ ලද නව සිනමාශාලා

| | |
|---|---|
| නිව් ලයින් සිනමා | - දඹුල්ල |
| ස්කයි ලයිට් | - මාතර |
| සිල්වර් | - යාපනය |
| ප්ලැටිනම් | - යාපනය |
| ගෝල්ඩ් | - යාපනය |
| එම්පයර් ලක්ෂාරි | - කොළඹ |
| එම්පයර් ඩිලක්ෂ් | - කොළඹ |
| G K සිනේ මැක්ස් | - කල්මුණේ |

ත්‍රිමාණ ප්‍රක්ෂේපණ අත්දැකීම් ශ්‍රී ලාංකේය ප්‍රේක්ෂකයන්ට ලබාගැනීම සඳහා පහත සිනමාශාලා වසර තුල 3D හා ඩිජිටල් (2k) තාක්ෂණයට ගමන්කර ඇත.

| **සිනමාශාලාව** | **නගරය** | **(2k) සිනමා** | **3D සිනමා** |
|---|---|---|---|
| ස්කයිලයිට් | මාතර | √ | √ |
| ගෝල්ඩ් | යාපනය | √ | |
| ප්ලැටිනම් | යාපනය | √ | |
| සිල්වර් | යාපනය | √ | |
| ඩොන් ප්ලාසා | කළුතර | √ | |
| G K සිනේ මැක්ස් | කල්මුණේ | √ | |
| දිනූෂා | නාවලපිටිය | √ | |
| එරීනා | කටුගස්තොට | √ | |
| එම්පයර් ලක්ෂාරි | කොළඹ | √ | √ |
| එම්පයර් ඩිලක්ෂ් | කොළඹ | √ | √ |
| සෙල්ලම් ප්‍රිමියර් | වෙන්කලඩි | √ | |
| මිලානෝ | කෑගල්ල | √ | √ |
| නිව් මිනර්වා | කළුතර | √ | |
| නෙල්සන් | ත්‍රිකුණාමලය | √ | |

**සිනමාශාලා පරික්ෂා කිරීම.**

වර්ෂය තුල සිනමාශාලා වාර 1147 පරික්ෂා කරන ලදි.

- 10/30 දර්ශනය - දර්ශන වාර 462
- 2/30 දර්ශන - දර්ශන වාර 489
- 6/30 දර්ශන - දර්ශන වාර 196

වර්ෂය තුල අයකරගත් ණය මුදල් - රු.2,305,831.83

සංස්ථා භාරය - රු. 171,147.30

දඩ මුදල් - රු.2,134,684.53

නිකුත් කල හරපත්‍ර වටිනාකම් - රු. 451,810.00

වර්ෂය තුල සිනමාශාලා 11 ආසන ගාස්තු සංශෝධනය සඳහා නිකුත් කර ඇත.

| | | |
|---|---|---|
| වර්ෂය තුල : | විදේශ රාජකාරි අධික්ෂණය | - වාර 41 |
| | වාර්තාමය | - වාර 26 |
| | වෙළඳ දැන්වීම් | - වාර 08 |
| | චිත්‍රපට | - වාර 07 |

## 15. සුභසාධනය

සංස්ථා සුභසාධනය සකසුරුවම් හා ණයදීමේ සමිතියේ කටයුතු, සමිතියේ සාමාජික සුභ සාධනය වෙනුවෙන් මෙම වර්ෂය තුලද ක්‍රියාත්මක විය.

## 16. ආගමික කටයුතු

### 16.1 බෞද්ධ සංගමය

වෙසක් පෙහොය නිමිති කොටගෙන සංස්ථා භූමියේ කෝපි දන්සැලක් පැවැත් වීම.

සංස්ථා සේවක මහත්මින්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් සඳහා අභ්‍යාස පොත් බෙදා දීම.

### 16.2 ක්‍රිස්තියානි සංගමය

වාර්ෂික නත්තල් සුභද හමුව 36 වෙනි වරටත් සංස්ථා පරිශ්‍රයේ දි පවත්වන ලදි.

## 17. වෛද්‍ය සහනාධාර ක්‍රමය

සාමාජික මුදල් හා සංස්ථාවෙන් ප්‍රදානය කරනු ලබන මුදල් මත පවත්වාගෙන යනු ලබන වෛද්‍ය සහනාධාර ක්‍රමය මෙම වර්ෂය තුල ද ක්‍රියාත්මක වු අතර, එහි පාලන කමිටුව පහත පරිදි වේ.

ඒ.එල්.ඩී.ටී.පෙරේරා මයා - කමිටු සභාපති (සහකාර සාමාන්‍යාධිකාරි - මුදල් (ආදායම්)

නාමල් වීරබාමු මයා - කමිටු සාමාජික (පරිපාලන නිලධාරි-පාලන හා මානව සම්පත්)

ආර්.පී.තිස්ස මයා - කමිටු සාමාජික (ලේකම් - ශ්‍රි ලංකා නිදහස් සේවක සංගමය)

කේ.ආර්.වින්සන් මයා - කමිටු සාමාජික (නියෝජිත - ජාතික සේවක සංගමය)

සුබිත ඉලංගකෝන් මයා - කමිටු සාමාජික (සභාපති - චිත්‍රපට සංස්ථා සේවක සංගමය)

එච්.ඩී.අසංක ගුණතිලක මයා - කාර්යභාර නිලධාරි

## 18. වෘත්තිය සමිති

ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, ජාතික සේවක සංගමය හා චිත්‍රපට සංස්ථා සේවක සංගමය මෙම වසර තුළදී ද පාලන අධිකාරිය සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇත.

## 19. ස්තුතිය

2014 වසරේ සාර්ථක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සංස්ථා කාර්ය මණ්ඩලය ඉතා වගකීමෙන් හා අප්‍රතිහත ධෛර්යෙන් යුතුව සිය සේවාවන් ඉටු කර ඇත. එම සේවාවන් අධ්‍යක්ෂ මණ්ඩලය ඉමහත් සේ අගය කරන අතර ඔවුන් වෙත සිය ස්තුතිය කෘතිවේදීව පලකර සිටියි.

නීතිඥ දීපාල් චන්ද්‍රරත්න
සභාපති
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2014.12.31 දිනට අවසන් වර්ෂය සඳහා
## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| විස්තරය | සටහන | 2014 | 2013 | 2014 ප්‍රදර්ශන | 2014 චිත්‍රාගාරය | 2014 නිෂ්පාදන | 2014 පොදු පරිපාලන වියදම් |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| විකුණුම් | **03** | 39,591,535 | 41,575,700 | 364,188 | 1,481,969 | - | 37,745,378 |
| අඩු කළා : විකුණුම් පිරිවැය | **04** | 7,341,871 | 5,572,100 | - | 10,638 | - | 7,331,232 |
| දළ ලාභය | | 32,249,664 | 36,003,600 | 364,188 | 1,471,331 | - | 30,414,145 |
| අඩු කළා : වියදම් | | | | | | | |
| සේවක පාරිශ්‍රමික | **05** | 62,390,237 | 59,714,904 | 10,522,003 | 8,509,160 | 3,115,959 | 40,243,115 |
| ගමන් හා යැපීම් දීමනා | **06** | 808,155 | 563,652 | 11,870 | 11,063 | 22,990 | 762,232 |
| සැපයුම් හා උපකරණ | **07** | 7,028,356 | 7,800,622 | 23,080 | 861,526 | 57,853 | 6,085,897 |
| අළුත්වැඩියා කිරීම් නඩත්තු හා ක්ෂයවීම් | **08** | 29,487,741 | 26,935,121 | - | 5,624,461 | - | 23,863,280 |
| ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | **09** | 18,496,419 | 17,283,927 | 159,527 | 2,147,923 | 1,472,256 | 14,716,713 |
| බොල් ණය සඳහා හානිකරන ගැලපීම් | | 3,750,161 | 24,779,026 | - | - | 4,312,604 | (562,443) |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 4,005,290 | 2,725,863 | 1,221,325 | 468,880 | 131,345 | 2,183,740 |
| චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල් සඳහා වෙන් කිරීම් | | 200,000 | 200,000 | - | - | 200,000 | - |
| තොග හානි | | 21,143 | 862 | - | - | - | 21,143 |
| | | 126,187,502 | 140,003,977 | 11,937,805 | 17,623,013 | 9,313,007 | 87,313,677 |
| පොදු පරිපාලන වියදම් අන්තර්ග්‍රහණය කිරීම් | | - | - | 13,970,188 | 11,350,778 | 3,492,547 | (28,813,513) |
| | | 126,187,502 | 140,003,977 | 25,907,993 | 28,973,791 | 12,805,554 | 58,500,164 |
| මෙහෙයුම් ලාභය / අලාභය | | (93,937,838) | (104,000,378) | (25,543,805) | (27,502,460) | 12,805,554 | (28,086,019) |
| එකතු කළා : වෙනත් ආදායම් | **10** | 55,745,191 | 45,662,551 | | | | |
| වසරේ ලාභය /අලාභය | | (38,192,647) | (58,337,827) | | | | |
| එකතු කළා : භාණ්ඩාගාර ලැබීම් | | 75,000,000 | 69,960,000 | | | | |
| බදු පෙර ලාභය | | 36,807,353 | 11,622,173 | | | | |
| අඩු කළා : බදු සඳහා වෙන් කිරීම් | | - | - | | | | |
| බදු පසු ලාභය | | 36,807,353 | 11,622,173 | | | | |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2014 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| නියෝජනය වන්නේ | | | |
| ස්ථාවර වත්කම් | | | |
| දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | 11 | 368,801,813 | 376,958,916 |
| දිගු කාලීන ආයෝජන | 12 | 127,000 | 127,000 |
| | | 368,928,813 | 377,085,916 |
| ජංගම වත්කම් | | | |
| කෙටි කාලීන ආයෝජන | 13 | 181,279,365 | 124,798,484 |
| තොග | 14 | 11,909,411 | 13,180,122 |
| ණයගැතියෝ | 15 | 123,136,192 | 140,639,948 |
| විවිධ ණයගැතියෝ | 16 | 149,472,335 | 26,958,338 |
| තැන්පතු හා ඉදිරි ගෙවීම් | 17 | 10,810,753 | 10,668,621 |
| මුදල් හා බැංකු ශේෂය | 18 | 21,578,961 | 30,075,160 |
| | | 498,187,017 | 346,320,674 |
| මුළු වත්කම් | | 867,115,830 | 723,406,590 |
| යෙදවූ ප්‍රාග්ධනය | | | |
| අනුදත් ප්‍රාග්ධනය | | 10,000,000 | 10,000,000 |
| සමුච්චිත ලාභය | | 314,730,054 | 273,324,184 |
| වෙනත් සංචිත | | 123,482,759 | 123,482,759 |
| | | 448,212,813 | 406,806,943 |
| ජංගම නොවන වගකීම් | | | |
| ප්‍රදානයන් | 19 | 136,862,813 | 138,062,990 |
| පාරිතෝෂික වෙන් කිරීම් | 20 | 34,060,813 | 32,225,489 |
| | | 170,923,626 | 170,288,479 |
| අඩු කළා : ජංගම වගකීම් | | | |
| තැන්පතු | 21 | 2,484,227 | 2,446,727 |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | 22 | 208,610,799 | 105,930,840 |
| වෙනත් ණයහිමියෝ | 23 | 36,884,365 | 37,933,601 |
| | | 247,979,391 | 146,311,168 |
| මුළු වගකීම් | | 867,115,830 | 723,406,590 |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව සකස් කර ඇත.

| | | |
|---|---|---|
| …………………… | ……………… | ……………… |
| වැ. බ. නි. සාමාන්‍යාධිකාරී - මුදල් | සභාපති | අධ්‍යක්ෂ |

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව ,
303 , බෞද්ධාලෝක මාවත ,
කොළඹ 07.

2015.05.25

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | හිමිකම් ප්‍රාග්ධනය රු. | සමුච්චිත ලාභය රු. | ප්‍රාග්ධන සංචිත රු. | ප්‍රත්‍යාගණන සංචිත රු. | වෙනත් සංචිත රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| **2014.01.01 දිනට ශේෂය** | 10,000,000 | 273,326,633 | 499,898 | 115,153,399 | 7,829,462 | 406,809,392 |
| පෙර වසර සඳහා කල ගැලපීම් ( සටහන ඒ ) | - | 4,596,068 | - | - | - | 4,596,068 |
| වසරේ ලාභය | - | 36,807,353 | - | - | - | 36,807,353 |
| **2014.12.31 දිනට ශේෂය** | 10,000,000 | 314,730,054 | 499,898 | 115,153,399 | 7,829,462 | 448,212,813 |

**සටහන ඒ**

පෙර වසර සඳහා කළ ගැලපුමෙහි අන්තර්ගත වනුයේ ,

- ⋆ 2012.01.01 දිනට සෙමෙන් භාවිතා වන සහ භාවිතා නොවන තොග සඳහා වෙන් කිරීමේදී චිත්‍රපටි තොගය වැඩියෙන් වෙන් කිරීම. - රු. 4,567,555.27
- ⋆ 2012.01.01 දිනට සෙමෙන් භාවිතා වන සහ භාවිතා නොවන ලිපිද්‍රව්‍ය සඳහා වෙන් කිරීමේදී ලිපි ද්‍රව්‍ය තොගය වැඩියෙන් වෙන් කිරීම. - රු. 28,512.63

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2014 | 2013 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්** | රු. | රු. |
| බද්ද අඩු කිරීමට පෙර ශුද්ධ ලාභය | (38,192,647) | (58,337,827) |
| (අඩු කළා ) | | |
| නිෂ්පාදන ණය මත පොළිය | - | (4,007,480) |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය | (10,267,443) | (11,787,366) |
| | (48,460,090) | (74,132,673) |
| **මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයයන් සඳහා ගැලපීම** | | |
| ක්ෂයවීම් | 20,762,242 | 17,780,018 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 4,005,290 | 2,725,863 |
| අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන | 3,750,161 | 24,779,026 |
| නඩත්තු වියදම් ප්‍රතිපාදන | 616,923 | - |
| හිමිකම් නොපෑවේතන සඳහා වෙන් කිරීම් | - | - |
| නොගෙවිය යුතු විකුණුම් බද්ද/හිමිකම් නොපෑවේතන ආදායමට හඳුනා ගැනීම් | - | (306,426) |
| භාවිතයේ නොමැති වත්කම් පොත් වලින් ඉවත් කිරීම | - | 202,448 |
| රාජ්‍ය ප්‍රදානයන් ආදායමට හඳුනා ගැනීම | (19,300,177) | (13,898,558) |
| ණයහිමි හානිකරණ ගැලපීම් | - | (4,193) |
| වාහන ඉවත් කිරීමෙන් ලද ආදායම | (2,611,420) | - |
| ණය පොලී කපා හැරීම | 211,878 | - |
| | (41,025,193) | (42,854,494) |
| **ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන්** | | |
| ඉකුත් කාල පරිච්ඡේද වල විෂයයන් සඳහා ගැලපීම | 4,598,518 | 12,124,686 |
| ස්ථාවර වත්කම් වලට ගැලපීම | - | 830,021 |
| කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය | (36,426,675) | (29,899,787) |
| **කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම්** | | |
| තොගය ( අඩුවීම) | 1,270,711 | 3,800,387 |
| ණයගැතියෝ ( වැඩිවීම) | (108,760,402) | 4,784,122 |
| තැන්පතු හා ඉදිරි ගෙවීම් ( වැඩිවීම ) | (354,010) | (347,016) |
| තැන්පතු ( වැඩිවීම ) | 37,500 | 60,000 |
| ණයහිමියෝ (වැඩිවීම) | 102,679,959 | 20,795,071 |
| වෙනත් ණයහිමියෝ ( අඩුවීම ) | (1,049,236) | (8,831,739) |
| | (42,602,152) | (9,638,962) |
| **අඩු කළා :** | | |
| පාරිතෝෂික ගෙවීම් | (2,169,965) | (4,386,297) |
| | (44,772,117) | (14,025,259) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| නිෂ්පාදන ණය පොලී | | |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොළිය | 10,267,443 | 15,794,846 |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | (15,146,200) | (54,949,905) |
| භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු ආයෝජනය | (56,480,881) | (19,291,587) |
| ස්ථාවර වත්ක විකිණීමෙන් ලැබු මුදල් | 4,535,556 | - |
| භාණ්ඩාගාර ලැබීම් | 93,100,000 | 76,960,000 |
| මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශුද්ධ වැඩිවීම් | (8,496,199) | 4,488,095 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය | 30,075,160 | 25,587,063 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය | **21,578,961** | **30,075,158** |

**මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම පිළිබද ප්‍රකාශය**

සංස්ථාවේ කළමනාකරණය ,

1. සංස්ථාවේ ආදායම සහ වියදම වත්කම් සහ වගකීම් සහ අනෙකුත් සියළු මූල්‍ය ගණුදෙනු පිළිබදව නිසි ගිණුම් පොත් තබා ගැනීම පිළිබදව ,

2. සංස්ථාවේ මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මූල්‍ය තත්ත්වය පිළිබද සත්‍ය හා සාධාරණ ඉදිරිපත් කිරීමක් සදහා , 1995 අංක. 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත යටතේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් සකස් කිරීම පිළිබදව හා

3. සංස්ථාවේ වත්කම් ආරක්ෂා කිරීමට හා වංචා සහ විෂමතා වැලැක්වීම සදහා උචිත පියවර ගැනීම පිළිබදව වගකිව යුතු වන්නේය.

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

**2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය**

---

1. **<u>පොදු තොරතුරු</u>**

**1.1.1 <u>පිහිටීම හා නීතිමය තත්ත්වය</u>**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව 1971 අංක. 47 දරන පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කොට පිහිටුවන ලදී. එහි ලියාපදිංචි කාර්යාලය , කොළඹ 07 , බෞද්ධාලෝක මාවතේ අංක.303 දරන ස්ථානයෙහි පිහිටියේය.

**1.1.2 <u>මූලික ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වරූපය</u>**

ශ්‍රී ලංකා චිත්‍රපට සංස්ථාව මූලිකවම ශ්‍රී ලංකාවේ චිත්‍රපට කර්මාන්තය ජගත් ප්‍රමිතීන්ට සමපාත වන සේ වර්ධනය කිරීමෙහිලා නිරතව සිටී.

**1.1.3 <u>නිකුත් කිරීම සඳහා අනුමත කළ දිනය</u>**

මෙම මූල්‍ය ප්‍රකාශනයන් බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015. 06. 18 දින අනුමැතිය දෙන ලදී.

**1.2 <u>ගිණුම් පිළියෙල කිරීමේ පදනම</u>**

**1.2.1 <u>අනුකූලතාව පිළබඳ ප්‍රකාශය</u>**

සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය , විස්තීර්ණ ආදායම , හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය , වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය සහිත සටහන් ( මූල්‍ය ප්‍රකාශන ) සකස් කරන ලද්දේ , ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය මඟින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) නියෝජනය වන පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූල වන පරිද්දෙනි.

**1.2.2. <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම</u>**

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ කළමනාකරීත්වය විසින් දරනු ලැබේ.

**1.2.3. <u>ගිණුම්කරණ පදනම</u>**

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් උචිත හෙළිදරව් කිරීමක් කර ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කොට සකස් කර ඇත.

1.2.4 **<u>අඛණ්ඩතාව</u>**

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කළමනාකරණය විසින් සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තක්සේරු කර ඇත. සංස්ථාව , එහි මෙහෙයුම් පෙනෙන අනාගත කාලය තුළදී පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් සම්පත් තිබෙන බව විශ්වාසනීයව අපේක්ෂා කරයි. තිබෙන්නා වූ සියලු තොරතුරු සැලකිල්ලට ගත් විට ඉදිරියේදී සංස්ථාව ඈවර කිරීමට හෝ එහි මෙහෙයුම් නතර කිරීමට හේතුවක් නොපෙනෙන අතර , අඛණ්ඩව පවත්නා ආයතනයක් සේ සලකා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

**1.2.5 <u>ශේෂ පත්‍ර දිනය වන විට නිකුත් කර ඇති නමුත් මෙතෙක් බලාත්මක නොවන නව ගිණුම් ප්‍රමිත</u>**

පහත දැක්වෙන නව ප්‍රමිතයන් , සංශෝධනයන් සහ පවත්නා ප්‍රමිත වල අර්ථ නිරූපනයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති නමුත් මෙම ගිණුම් අනුමත කරන දිනය දක්වා ඒවා බලාත්මක වී නොමැත. මෙම පහත දැක්වෙන ප්‍රමිත වලට අනුගත වීම මඟින් ඇතිවිය හැකි බලපෑම මෙතෙක් ඇස්තමේන්තු කර නැති අතර , එම නව ප්‍රමිතයන් , සංශෝධනයන් සහ පවත්නා ප්‍රමිත වල අර්ථ නිරූපනයන් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වලට අදාල වේයැයි අපේක්ෂා කරන හෙයින් බලාත්මක වු විට ඒවා භාවිතා කිරීමට කළමනාකාරීත්වය අපේක්ෂා කරයි.

SLFRS 9 මූල්‍ය සාධාන පත්‍ර ( Financial Instruments )

SLFRS 12 අනෙකුත් අස්තිත්වයන්හි හිමිකම් හෙළිදරව් කිරීම.
(Disclosure of interests in other entities)

SLFRS 13 සාධාරණ අගය මැනීම. (Fair value measurements)

**1.2.6 ක්‍රියාත්මක වීමේ හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්**

සංස්ථාවේ ක්‍රියාකාරී ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

**1.2.7 වැදගත් වන ගිණුම්කරණ විනිශ්චයන් , ඇස්තමේන්තු සහ උපලේඛන**

වාර්තා කරන දිනයේදී වාර්තා කරන ලද ආදායම් , වියදම් , වත්කම් සහ බැරකම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීම පිළිබඳව වාර්තා කරන ලද සංඛ්‍යාවන්ට බලපාන විනිශ්චයන් , ඇස්තමේන්තු හා උපකල්පනයන් කිරීමට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට අවශ්‍ය වේ. කෙසේ වුවද , මෙම උපකල්පනයන්ගේ හා ඇස්තමේන්තු වල තිබෙන්නා වූ අවිනිශ්චිතභාවය හේතුවෙන් අනාගතයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම් වල සැලකිය යුතු ගැලපීම් කිරීමට අවශ්‍ය වන්නා වූ බලපෑම් ඇතිවිය හැකිය. මෙම කාරණයන්හි විනිශ්චයන් , ඇස්තමේන්තු හා උපකල්පනයන් ඇතුළත් විය හැකිය.

ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂයේදී වත්කම් හා බැරකම් වල පවත්නා වටිනාකම්හි සැලකිය යුතු ගැලපීම් කිරීමට සිදූ වන්නා වූ , විශේෂිත අවදානම් ඇතිවිය හැකි , වාර්තා කරන දිනට පැවති අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පනයන් හා ඇස්තමේන්තු මූලාශ්‍රයන් පහත දක්වා ඇත.

(අ) <u>මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය</u>

ශේෂ පත්‍රයෙහි වාර්තා කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළෙඳ පොලේ ව්‍යුත්පන්න විය නොහැකි අතර , ඒවා වට්ටම් කළ මූල්‍ය ප්‍රවාහනයන් සහ / හෝ ගණිතමය ආකෘති ඇතුළු ශිල්ප ක්‍රම භාවිතා කරමින් නිශ්චය කර ඇත. මෙම ආකෘති වල යෙදවුම් , හැකි අවස්ථාවන්හිදී නිරීක්ෂණය කළ හැකි වෙළෙඳ පොල දත්තයන්ද එවැනි දෑ නොමැති විට විනිශ්චය කිරීමෙන්ම ලබා ගන්නා ලදී.

මෙම සාධකයන් පිළිබඳ උපකල්පනයන්හි වෙනස්වීම් වාර්තා කර ඇති මූල්‍ය සාධන පත්‍රයන්හි සාධාරණ අගය කෙරෙහි බලපෑ හැකිය.

(ආ) **<u>සාධාරණ අගය</u>**

සාධාරණ අගය යනු දැනුමක් හා කැමැත්තක් ඇති පාර්ශව අතර අතේ දුරින් සිදු වු ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු කළ හැකි අගයයි. මූල්‍ය සාධන පත්‍රයක් මුලින්ම හඳුනා ගැනීමේදී එහි සාධාරණ අගය ලෙස සාමාන්‍යයෙන් ගැනෙන්නේ ලැබූ හෝ ගෙවූ වටිනාකමයි. පසුකාලීනව මූල්‍ය වත්කමක සාධාරණ අගය වන්නේ සක්‍රීය වෙළඳපොලක ඉල්ලුම් කෙරෙන ලංසු තබන මිළයි. මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ඉල්ලුම් කරන මිළයි. මුදල් හා සමාන දෑ සහ කෙටි කාලීන ආයෝජන සඳහා පවත්නා අගය වන්නේ සාධාරණ මිළයි.

## 2. <u>විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

### 2.1 **<u>වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම</u>**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මුදල් හා බැංකු ශේෂයන් සහ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේදී හෝ වර්ෂයක් තුළ හෝ යන දෙකින් අඩු කාල සීමාවේදී මුදල් බවට උපලබ්ධි වන ඒවාය.

## 2.2 <u>මූල්‍ය සාධන පත්‍ර</u>

### 2.2.1 <u>මූල්‍ය වත්කම් ( ව්‍යුත්පන්න නොවන )</u>

මූල්‍ය වත්කම් පහත සදහන් කොටස් වලට වර්ගීකරණය කෙරේ. ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට අගය කළ දෑ , ණය සහ ලැබිය යුතු දෑ , කල් පිරෙන තුරු හෝ විකිණීමට තිබෙන දෑ , මෙම වර්ගීකරණය කළමනාකරණය විසින් නිර්ණය කරන ලද්දේ මූලික හඳුනා ගැනීම හා එම ආයෝජන අත්පත් කර ගැනීමේ අරමුණ පදනම් කොට ගෙනය.

### 2.2.2 <u>වර්ගීකරණය , හඳුනා ගැනීම සහ මැනීම.</u>

කළමනාකරණය විසින් එහි මූල්‍ය වත්කම් පහත සදහන් ලෙස වර්ගීකරණය කරයි.

අ. ණය සහ ලැබිය යුතු දෑ

ආ. විකිණීම සදහා ඇති දෑ

**අ. ණය සහ ලැබිය යුතු දෑ**

ස්ථාවර හෝ සක්‍රීය වෙළෙඳපොලේ මිළ ප්‍රකාශ නොවන , තීරණය වූ ගෙවීම් සහිත මූල්‍ය වත්කම්ය. මෙම වත්කම් මුලින්ම සාධාරණ වටිනාකමට එකතු වූ සෘජුවම අදාල වන ගණුදෙනු පිරිවැය හඳුනා ගනු ලැබේ. පසුකාලීනව ණය සහ ලැබිය යුතු දෑ සඵල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය කිරීමත් , යම් හානිකරණ පාඩුවක් වේනම් එයත් සැලකිල්ලට ගෙන මනිනු ලැබේ.

**ආ. විකිණීම සදහා ඇති මූල්‍ය වත්කම්**

විකිණීම සදහා ඇති මූල්‍ය වත්කම් යනු නිශ්චිත නොවූ කාල පරිච්ඡේදයක් තබා ගැනීමට අදහස් කරන , ද්‍රවශීලතා හේතු හෝ පොලී අනුපාත වෙනස්වීම මත , විනිමය අනුපාත වෙනස්වීම මත හෝ ස්කන්ධ මිළ මත විකිණීමට අවශ්‍ය විය හැකි හෝ ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර නොමැති කල් පිරෙන තුරු තබා ගන්නා හෝ ලාභ හෝ අලාභ මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්ය.

### 2.2.3 සාධාරණ අගය නිශ්චය කිරීම.

ණය සහ අත්තිකාරම් මෙන්ම වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීමේදී වර්තමාන අගය ආකෘතිය එකඟ වූ මුදල් ප්‍රවාහයන් පදනම් කොට ගෙන ණයෙහි ගුණාත්මකභාවයද , ද්‍රවශීලතාව හා පිරිවැයද සැලකිල්ලට ගෙන නිර්ණය කෙරේ. වෙළෙඳ ලැබිය යුතු හා ගෙවිය යුතු අයිතම වල ආසන්න සාධාරණ අගය ලෙස සැලකෙන්නේ පවත්නා වටිනාකමින් හානිකරණය සඳහා අඩු කළ පසු ඉතිරියයි.

### 2.2.4 ප්‍රති වර්ගීකරණය

ණය හා ලැබිය යුතු දැහැර මූල්‍ය වත්කම් , වෙළදාම සඳහා අයිතමයන්ගෙන් වෙන් කොට වර්ගීකරණය කිරීමට ඉතා කලාතුරකින් ඇතිවිය හැකි පරිසරයකදී හුදෙකලා සිදුවීමක් ලෙස අවසර දෙනු ලැබේ. ණය සහ ලැබිය යුතු දෑ අතරින් වෙළදාම සඳහා වූ දේ ලෙස ප්‍රති වර්ගීකරණය කිරීම සංස්ථාව විසින් ණය සහ ලැබිය යුතු දෑ යන නිර්වචනයට අදාළ වන්නේනම් ප්‍රතිවර්ගීකරණය තොරා ගනු ඇත.

ප්‍රතිවර්ගීකරණය කරනු ලබන්නේ එසේ කරන දිනට ඇති සාධාරණ අගයටයි. සාධාරණ අගය වන්නේ නව පිරිවැය හෝ ක්‍රමක්ෂය පිරිවැය මතය.

### 2.2.5 හානිකරණය

#### (අ) ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන මූල්‍ය වත්කම්

එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වී ඇති බවට වන සාක්ෂි සංස්ථාව විසින් අගය කෙරේ. වත්කමෙහි ආරම්භක හඳුනා ගැනීමෙන් පසු ඇති වූ අවස්ථා එකක හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස ( දරන ලද අලාභ අවස්ථා ) අගය අඩුවීමක පරමාර්ථ සාක්ෂියක් තිබේනම් සහ එම අලාභ අවස්ථාවට මූල්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ හෝ විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තුගත කළ හැකි මූල්‍ය වත්කම් කාණ්ඩයක් මත බලපෑමක් ඇත්නම් පමණක් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් අගය අඩු වූ බවට සලකනු ලැබේ. අගය අඩුවන බවට වන සාක්ෂි ලෙස , ණයකරුවෙකු හෝ ණයකරුවන් කාණ්ඩයක් සැලකිය යුතු මූල්‍ය දූෂ්කරතා වලට මුහුණ දෙමින්

සිටින බව පෙන්වීම , පොළියෙහි හෝ මුලධන ගෙවීම් වල පැහැර හැරීම් , ඔවුන් බංකොළොත්භාවයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඇති හැකියාව සහ පැහැර හැරීම් සමග සහසම්බන්ධිත ආර්ථික තත්ත්ව හෝ හිග මුදල් වල වෙනස්වීම් වැනි ඇස්තමේන්තුගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල ඇගයිය හැකි අඩුවීමක් නිරීක්ෂණය කළ හැකි දත්ත මින් පෙන්වීම , ඇතුළත් විය හැකි වේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ මූල්‍ය වත්කම් සදහා , තනි තනි වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම් සඳහා තනි තනි වශයෙන් අගය අඩුවීම්හි පරමාර්ථ සාක්ෂි තිබේදැයි සංස්ථාව විසින් පළමුවෙන් තනි තනි වශයෙන් අගයන අතර , තනි තනි වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමුහිකව අගයයි. වැදගත් වුවත් , නොවුවත් තනි තනි වශයෙන් අගයනු ලැබූ මූල්‍ය වත්කමක අගය අඩුවීම පිළිබඳ පරමාර්ථ සාක්ෂියක් නොමැති බව සමුහය විසින් නිශ්චය කළහොත් එය , එම වත්කම සමාන බැර අවදානම් ලක්ෂණ සහිත වත්කම් කාණ්ඩයක ඇතුළත් කරන අතර ඒවා අගය අඩුවීම සඳහා සාමුහිකව අගයනු ලැබේ.

අගය අඩුවීම සඳහා තනි තනි වශයෙන් අගයනු ලැබූ සහ අගය අඩුවීමක් සහිත හෝ දිගින් දිගටම හඳුනා ගැනීමට නියමිත වත්කම් අගය අඩුවීමෙහි සාමුහික ඇගයීමට ඇතුළත් කරනු නොලැබේ.

ක්‍රමක්ෂිත පිරිවැයට ගෙන ආ වත්කම් මත අගය අඩුවීමේ අලාභ දරා ඇති බවට පරමාර්ථ සාක්ෂියක් ඇති විට , වත්කමෙහි පවතින වටිනාකම සහ මූල්‍ය වත්කමෙහි මුල් ඵලදායි පොළි අනුපාතිකයට වට්ටම්ගත අනාගත මූල්‍ය ප්‍රවාහ වල වර්තමාන වටිනාකම ( නොදරන ලද අනපේක්ෂිත අනාගත ණය අලාභ හැර ) අතර වෙනසින් අලාභයෙහි ප්‍රමාණය අගයනු ලැබේ. ණයක් සඳහා වෙනස් වන පොළි අනුපාතියක් පවතී නම් . යම් අගය අඩුවීමේ අලාභයක් ඇගයීම සඳහා වට්ටම්ගත අනුපාතය වන්නේ වර්තමාන ඵලදායි පොලී අනුපාතයයි. වත්කමෙහි පවතින වටිනාකම දීමනා ගිණුමක් භාවිතා කිරීම හරහා අඩු වන අතර , හානිවන ප්‍රමාණය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. පොලී ආදායම . අඩු වු පවතින වටිනාකම මත එක්රැස් වීම පවත්වා ගෙන යනු ලබන අතර එය අගය අඩු වීමේ අලාභ ඇගයීමේ කාර්යය සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම්ගත කළ පොලී අනුපාතය භාවිතා කරමින් එක් රැස් කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයෙහි ආයෝජන ආදායම් වල කොටසක් ලෙස පොලී ආදායම වාර්තා

කරනු ලැබේ. අනාගත අය කර ගැනීමෙහි තාත්වික අපේක්ෂාවන්ක නොමැති විට ආශ්‍රිත දීමනා සමඟින් ණය කපා හරිනු ලබන අතර , සියලු සුරැකුම් සමුහයට උපලබ්ධි කර හෝ පවරාගෙන ඇත. ආසන්න වර්ෂයකදී අගය අඩුවීම හඳුනා ගැනීමෙන් පසු යම් හේතුවක් නිසා ඇස්තමේන්තුගත අගය අඩුවීමේ අලාභය වැඩි වේ නම් හෝ අඩු වේනම් දීමනා ප්‍රමාණය සීරුමාරු කර පෙර හඳුනා ගනු ලැබූ අගය අඩුවීමේ අලාභය වැඩි හෝ අඩු කරනු ලැබේ. අනාගත කපා හැරීමක් පසුව අය කර ගතහොත් එම අය කිරීම ආදායම් ප්‍රකාශනයෙහි දීමනා (Allowance) ගිණුමට ගලපනු ලැබේ.

**(ආ) අනෙකුත් මූල්‍යමය නොවන වත්කම් හානිකරණය**

වත්කමක පවත්නා අගය අය කර ගත නොහැකි බව පෙනෙන පරිසරයකදී හානිකරණය සඳහා විමසා බැලීමට යටත් වේ. පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම යන ඒවායින් ඉහළ අගය වේ.

**2.2.6 හඳුනා ගැනීම අත් හැරීම.**

මූල්‍ය වත්කමක් ( හෝ කොටසක් හෝ සමුහයක කොටසක් ඇතුලුව ) හඳුනා ගැනීම අත් හරින අවස්ථා මෙසේය.

- මූල්‍ය ප්‍රවාහයන් ලැබීමේ අයිතිය ඉකුත් වීම.
- සංස්ථාව විසින් වත්කම මඟින් මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය පැවරීම හෝ ලැබුණු මුදල් ප්‍රවාහයන් තුන්වන පාර්ශවයකට පවරා දිය යුතු යැයි උපකල්පනය කිරීම.

(අ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීම.

(ආ) සංස්ථාව විසින් සියලු ප්‍රතිලාභ හා අවදානම් පවරා දීමක් හෝ රඳවා ගැනීමක් නොකොට පාලන අයිතිය පැවරීම.

**2.2.7** නීතිමය අයිතියක් ඇති අවස්ථා වල මූල්‍ය වත්කම් හා වගකීම් සමාහරණය කොට ශුද්ධ අගය දක්වා ඇත.

**2.3. දේපළ , යන්ත්‍ර හා උපකරණ**

**2.3.1 හඳුනා ගැනීම හා මැනීම.**

දේපළ , යන්ත්‍ර හා උපකරණ අයිතමයන් ඒවායේ සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ තක්සේරු අගයට පෙන්වා ඇත. පිරිවැය තුළ වත්කම අත් කර ගැනීමේදී දැරූ වියදම් වලින් සෘජුවම අදාල වන වියදම් ඇතුලත් වේ. ස්වයං නිර්මිත වත්කම් වල එම වත්කම් භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා දැරූ ද්‍රව්‍යය පිරිවැය , සෘජු ශ්‍රමය , සෘජුවම බලපාන වෙනත් අදාල වියදම් ඇතුළත් වේ. අළුත්වැඩියා හා ඉදිරි අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ වෙනුවෙන් දරන ලද වියදම් ඒවා දරන අවස්ථාවේ වියදම් ලෙස හඳුනාගෙන ඇත.

**2.3.2 පසුකාලීන පිරිවැය**

උපාංග ප්‍රතිපූර්ණය සඳහා දරන ලද වියදම වෙන් වෙන්ව එනම් පුළුල් පරීක්ෂාවන් හා පූර්ණ අළුත්වැඩියා වියදම් ප්‍රාග්ධනගත කෙරෙන්නේ ඒවායේ ආර්ථික ප්‍රතිලාභ ලැබීමට හේතු වන්නේනම් හා එම ප්‍රතිලාභ විශ්වාසදායකව මැනිය හැකි නම්ය. දෛනික සේවා කිරීම් ඒවා දරන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

**2.3.3 ක්ෂය වීම්**

ක්ෂය සඳහා වෙන් කිරීම සරල මාර්ග ක්‍රමය අනුව පිරිවැය / තක්සේරු අගය මත ගණනය කෙරේ. ඉඩම් හැර දේපළ , යන්ත්‍ර හා උපකරණ පහත දැක්වෙන ප්‍රතිශත නඅවු ප්‍රයෝජනවත් ආයු කාලය තුළදී ශේෂය ගණනය කෙරේ.

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | - | ප්‍රධාන කාර්යාලය | 2.5% |
| | - | ශ්‍රවණාගාරය | 5% |
| චිත්‍රපට සංකීර්ණය | - | ගොඩනැගිලි | 5% |
| | - | අනෙකුත් යන්ත්‍ර සූත්‍ර | 10% |
| ලී බඩු සවි කිරීම් | | | 25% |
| මෝටර් රථ | | | 25% |

| | |
|---|---|
| චිත්‍රපට සංරක්ෂණාගාරය | 10% |
| සංස්කෘතික / අධ්‍යාපනික / චිත්‍රපට උපකරණ | 10% |
| චිත්‍රපට උපකරණ | 10% |
| සුභසාධන උපකරණ | 10% |

දේපළ පිරියත හා උපකරණ මිළදී ගත් දිනෙන් ආරම්භව ක්ෂය කරනු ලැබේ.

**නොනිම් ප්‍රාග්ධන කාර්‍යයන්** - ඉදි කරමින් පවතින චිත්‍රාගාර ගොඩනැගිල්ල නොනිම් ප්‍රාග්ධන ගොඩනැගිලි වශයෙන් පෙන්නුම් කර ඇත.

### 2.3.4 හඳුනා ගැනීම ඉවත් කිරීම.

දේපළ , පිරියත සහ උපකරණ අයිතමයක පවතින වටිනාකම අපහරණයකදී හෝ ඒවායින් අනාගත ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීම නතර වේ. දේපළ , පිරියත හා උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය අයිතමය හඳුනා නොගන්නා විට අදායම් ප්‍රකාශනයෙහි ඇතුලත් කරනු ලැබේ.

### 2.3.5 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

මූල්‍ය නොවන වත්කම් වල අගය අඩුවීමක කිසියම් ඇඟවීමක් තිබේදැයි නිශ්චය කිරීම සඳහා විලම්භිත බඳු වත්කම් හාර සමූහයෙහි මූල්‍යමය නොවන වත්කම් වල පවතින වටිනාකම් ඒ ඒ වාර්තාකරණ දිනට සමාලෝචනය කරනු ලැබේ. එවැනි තත්ත්වයක් ඇත්නම් , එවිට වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. අවිනිශ්චිත ඵලදායි ආයු කාලයක් සහිත හෝ මේ වන තෙක් භාවිතය සඳහා නොපවතින අස්පෘශ්‍ය වත්කම් සඳහා අය කර ගත හැකි වටිනාකම එක් එක් වර්ෂයේදී එම අවස්ථාවේදීම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක පවතින වටිනාකම එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි වටිනාකම ඉක්මවා යන්නේනම් අගය අඩුවීමක අලාභයක් හඳුනා ගනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදක ඒකකයක අය කර ගත හැකි වටිනාකම වන්නේ එහි භාවිතා කරනු ලබන වටිනාකම සහ එහි සාධාරණ වටිනාකමින් විකුණුම් පිරිවැය අඩු කළ විට ලැබෙන වටිනාකම

යන ඒවායින් ඉහළ අගය වේ. භාවිතයේ ඇති වටිනාකම (Value in use ) ඇගයීමේදී , මුදලෙහි කාලීන අගයෙහි වර්තමාන වෙළෙඳපොල ඇගයීම පිළිබිඹු කරනු ලබන බදු පෙර වට්ටම් අනුපාතයක් සහ වත්කමට හෝ මූල්‍ය උත්පාදක ඒකකයට විශේෂිත අවදානම් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ.

අගය අඩුවීම පරීක්ෂා කිරීමේ අරමුණ සඳහා තනි තනිව පරීක්ෂා කළ නොහැකි වත්කම් වෙනත් වත්කම් වලින් මුදල් ගැලීමෙන් විශාල වශයෙන් නිදහස් වන නොකඩවා පාවිච්චියෙන් මුදල් ගැලීම උත්පාදනය කරනු ලබන කුඩාම වත්කම් කාණ්ඩයකට කාණ්ඩගත කරනු ලැබේ. අගය අඩුවීමේ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

### 2.4 <u>තොග</u>

සියළු තොග පිරිවැය හෝ ශුද්ධ ප්‍රත්‍යාගණන අගය යන දෙකින් අවමයට අගය කෙරේ. පිරිවැය පළමු ඇතුළු - පළමු පිට (FIFO) ක්‍රමය පදනම් කොටගෙන තීරණය කෙරේ.

### 2.5 <u>ආදායම් බදු</u>

සංස්ථා සේවකයන්ගේ පඩි හා අනෙකුත් දීමනාද , වියදම් වලින් කොටසක් පියවීම සඳහාද , භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙනු ලැබේ. භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් සඳහා බදු නොගෙවිය යුතුය යන පදනම මත බදු ගෙවීම සඳහා වෙන් කිරීමක් කර නොමැත.

සංස්ථාව විසින් වාර්ෂිකව ලැබූ ලාභය ආදායම් බදු ගෙවීමෙන් පසු ඇති වූ අතිරික්තයෙන් 25% ක ප්‍රමාණයක් ලාභය වෙනුවෙන් බදු ගෙවිය යුතුය යන්න අපගේ මතය වන අතර , එම ප්‍රමාණය විය යුත්තේ ආදායම් බදු සඳහා සිදු කළ ගැලපුම් කටයුතු වලින් පසු ඉතිරි ශුද්ධ ලාභය යන්න අපගේ විශ්වාසයයි.

## 2.6 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් වල අනෙකුත් ණයගැතියන් සහ ලැබිය යුතු දෑ , අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවීම් , ලැබිය යුතු බද්දු ඇතුළත් වේ.

### (අ) අත්තිකාරම් , තැන්පතු , කලින් ගෙවූ වියදම්

එක් මුදල් වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා ප්‍රතිලාභ ලැබෙතැයි පෙනෙන යම් සබඳතායක් ඇති වියදම් අත්තිකාරම් , තැන්පතු හා කලින් ගෙවූ වියදම් ලෙස වර්ගීකරණය කරන ලදී. එවැනි වියදම් කාල පදනම මත අදාළ කාල පරිච්ඡේදය තුළ කපා හරිනු ලැබේ.

### (ආ) අනෙකුත් ණයගැතියෝ

අනෙකුත් ණයගැතියන් පිරිවැයෙන් හානිකරණය අඩු කළ වටිනාකමට හඳුනාගෙන ඇත.

## 2.7 මුදල් සහ මුදල් හා සමාන දෑ

ඒවායේ සාධාරණ අගයෙහි වෙනස්වීමට නොසැලකිය යුතු තරමේ අවදානමකට භාජනය වන අත්පත් කර ගත් දින සිට මාස 03 ක් කල් පිරුණු හෝ ඊට අඩු කල් පිරීමක් සහිත සහ සමූහය විසින් එහි කෙටිකාලීන වගකීම් කළමනාකරණය සඳහා යොදා ගන්නා මුදල් ශේෂ සහ ඉල්ලුම් තැන්පතු වලින් මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වේ.

## 2.8 මූල්‍ය වගකීම්

### 2.8.1 ආරම්භක හඳුනා ගැනීම හා මැනීම.

LKAS 39 අනුව මූල්‍ය වගකීම් වර්ග කොට ඇත්තේ , උචිත පරිදි ලාභය හෝ අලාභය මඟින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වගකීම් හෝ ණය හෝ ණයට ගැනීම්ය. සංස්ථාව එහි මූල්‍ය වගකීම් ආරම්භක හඳුනා ගැනීම අනුව වර්ගීකරණය නිශ්චය කර ඇත. සියළු මූල්‍ය වගකීම් මුලින්ම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර , ණය හා ණය ගැනුම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය ක්‍රමය භාවිතා කරයි. මෙහි ඍජුවම අදාළ වන ගනුදෙනු පිරිවැය ඇතුළත්ය.

සංස්ථාවේ මූල්‍ය වගකීම් වල වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුලත්ය.

### 2.8.2 <u>පසුකාලීන මිනුම්</u>

මූල්‍ය වගකීම් මිනුම පහත දැක්වෙන පරිදි ඒවායේ වර්ගීකරණය මත පදනම් වේ.

### 2.8.3 <u>ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම්</u>

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් වල වෙළඳාම සඳහා වූ මූල්‍ය වගකීම් සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මත මූල්‍ය වගකීම් මත නම් කරන ලද ඒවා ඇතුළත් වේ. මූල්‍ය වගකීම් , වෙළඳාම සඳහා පවත්නා දේ ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ ඒවා නුදුරේදී විකිණීමේ අරමුණ ඇත්නම්ය. වෙළඳාම සඳහා වගකීම් මත ලැබීම් හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. සංස්ථාව කිසිදු මූල්‍ය වගකීමක් ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට මූලික හඳුනා ගැනීම නම් කර නැත.

### 2.9 <u>අනෙකුත් මූල්‍ය වගකීම්</u>

ණය සහ ණය ගැනුම් ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අනෙකුත් මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් ක්‍රමාක්ෂය ක්‍රමය භාවිතා කරයි.

### 2.10 <u>අනෙකුත් වගකීම්</u>

අනෙකුත් වගකීම් වල උපචිත වියදම් ද ඇතුලත්ය. මේවා ඒවායේ සාධාරණ අගය ලෙස සැලකෙන ඓතිහාසික වටිනාකමට දක්වා ඇත.

### 2.11 <u>රජයේ ප්‍රදාන</u>

වත්කම් වලට අදාළ රජයේ ප්‍රදාන මේවා ශේෂ පත්‍රයේ විලම්භනය කර අදාළ වත්කමේ ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට හඳුනා ගනු ලබන අතර , වියදම් පියවීම සඳහා ලැබෙන්නා වූ ලැබීම් , ලැබීම් පදනම මත ගිණුම්ගත කෙරේ.

## 2.12 සේවක ප්‍රතිලාභ

### නිර්ණය කළ දායක සැලැස්ම

අදාළ ව්‍යවස්ථා හා රෙගුලාසි ප්‍රකාර , සේවක අර්ථසාධක අරමුදල් හා සේවා භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයෝ හිමිකම් ලබති. සංස්ථාව විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකය මත ස්ථාවර දායකයක් මෙකී අරමුදල් වලට ගෙවන අතර , ඉන් අමතරව නීතිමය හෝ හෝ අර්ථකාරී බැඳීමක් සංස්ථාව කෙරෙහි නොමැත.

### නිර්ණය කළ ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමකට වෙනස් වූ පශ්චාත් සේවා නියුක්ත ප්‍රතිලාභ සැලසුමක් වේ. මේ සම්බන්ධව 1983 අංක. 12 දරන පාරිතෝෂික පනත යටතේ සංස්ථාව බැඳී සිටී.

## 2.13 ආදායම

### 2.13.1 නිෂ්පාදක ණය පොලිය හා අධි භාරය

නිෂ්පාදකයින් වෙත ලබා දී ඇති ණය මුදල් සඳහා පොලිය ගිණුම්ගත කර ඇත්තේ අදාළ චිත්‍රපට ප්‍රදර්ශනය වී අවුරුද්දක් ගත වන තෙක් පමණි. යම් අවස්ථාවක ණය මුදල් සම්පූර්ණ අය වන්නේනම් අදාල පොලියද ගණනය කර අය කිරීමට කටයුතු කරනු ලැබේ.

සිනමාශාලා වලින් අය වීමට ඇති මුදල් සඳහා ගැසට් නිවේදනයේ පරිදි අධිභාරය ගණනය කර ගිණුම්ගත කර තිබේ.

### 2.13.2 ප්‍රදර්ශනය සඳහා මුදා හැර ඇති චිත්‍රපට

චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේදී ආදායම නොලැබීම මත ණය මුදල් අය නොවීමේ තත්ත්වයක් තුළ චිත්‍රපට මුදා හැර මාස 06 කට පසු පොලිය ගිණුම්ගත කරනු නොලැබේ.

### 2.13.3 <u>ප්‍රදර්ශනය නොවූ චිත්‍රපට</u>

**(අ)** චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබා දී ඇති එහෙත් පසුගිය වර්ෂ දෙකක සේවාවන් ලබාගෙන නොමැති චිත්‍රපට වලට පොළිය ගිණුම්ගත කර නොමැත.

**(ආ)** චිත්‍රාගාර සේවා ලබා දීමේදී දීර්ඝ කාලයක් තුළ සේවාවන් ලබා නොගෙන නිෂ්පාදන කටයුතු නවතා ඇති චිත්‍රපට සඳහා පොළිය ගිණුම්ගත කොට නොමැත.

ඉහත සඳහන් කරුණු 02 යටතේ වර්ෂයේ පොළිය ගණනය නොකලද , යම් අවස්ථාවක මෙම ණය මුදල් අය කර ගැනීමේදී පොළිය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

### 2.13.4 <u>සිනමාහල් අධිභාර</u>

සිනමාශාලා වලින් ලැබිය යුතු චිත්‍රපට කුළිය සඳහා අයවිය යුතු අධිභාර මුදලින් 100% ක් නොලැබේය යන පදනම මත 25% ක් පමණක් ආදායමට ගෙන තිබේ.

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2014.12.31 දිනට අවසන් වර්ෂයේ**
**ආදායම් ප්‍රකාශන සඳහා සටහන්**

| | | | 2014 | 2013 |
|---|---|---|---|---|
| **(03)** | **විකුණුම්** | | රු. | රු. |
| | එළිය කැවු චිත්‍රපට | **3.1** | 28,337,822 | 35,278,807 |
| | ප්‍රදර්ශන | **3.2** | 364,188 | 300,308 |
| | චිත්‍රාගාරය | **3.3** | 1,481,969 | 2,269,993 |
| | වෙළඳ කටයුතු | **3.4** | 9,407,556 | 3,726,593 |
| | | | 39,591,535 | 41,575,701 |

| | | 2014 | 2013 |
|---|---|---|---|
| **3.1** | **එළිය කැවු චිත්‍රපට** | | |
| | දේශීය චිත්‍රපට කුළිය | 9,854 | 10,309 |
| | පෙරදිග චිත්‍රපට කුළිය | - | 19,766 |
| | *බෙදා හැරීමේ කොමිස්* | | |
| | දේශීය | 10,567,571 | 13,496,493 |
| | විදේශීය | 8,495,208 | 9,643,952 |
| | වැඩිවීම | 5,630,449 | 6,620,181 |
| | සේවාවන් සඳහා කොමිස් | 116,093 | 105,178 |
| | අධිභාරය | 3,061,887 | 3,625,698 |
| | පරීක්ෂණ දඩ මුදල් | 456,760 | 1,757,230 |
| | | 28,337,822 | 35,278,807 |
| **3.2** | **ප්‍රදර්ශන** | | |
| | සිනේ ඇඩ්ස් | 364,188 | 300,308 |
| | | 364,188 | 300,308 |

| | | චිත්‍රපට ප්‍රමාණය | 2014 | චිත්‍රපට ප්‍රමාණය | 2013 |
|---|---|---|---|---|---|
| **3.3** | **චිත්‍රාගාරය** | | | | |
| | ශබ්ද | 21 | 1,208,906 | 26 | 1,703,062 |
| | සංස්කරණය | 17 | 273,063 | 12 | 562,349 |
| | රසායනාගාරය ( කළු - සුදු ) | - | - | 2 | 4,582 |
| | | | 1,481,969 | | 2,269,993 |

| | | ප්‍රමාණය | 2014 | ප්‍රමාණය | 2013 |
|---|---|---|---|---|---|
| **3.4** | **වෙළඳ කටයුතු** | | | | |
| | සිනමා කාබන් | 45,250 | 2,496,080 | 39,250 | 1,764,268 |
| | අමතර කොටස් | - | 5,507,545 | | 40,073 |
| | ලිපි ද්‍රව්‍යය | - | 1,185,398 | | 1,592,257 |
| | අභ්‍යන්තර භාවිතය සඳහා විකුණුම් | | | | |
| | අමතර කොටස් - | | 20,840 | | 316,045 |
| | ලිපි ද්‍රව්‍යය පිරිවැය | | 197,693 | | 13,950 |
| | | | 9,407,556 | | 3,726,593 |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2014.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**(04)** **විකුණුම් පිරිවැය**

| | ප්‍රදර්ශන | චිත්‍රාගාරය | පොදු පරිපාලන වියදම් | 2014 එකතුව | 2013 එකතුව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| තොගය 2014.01.01 | 5,253,887 | 1,835,218 | 16,769,843 | 23,858,948 | 28,288,353 |
| එකතු කළා : | | | | | |
| මිලදී ගැනීම් හා මාරු කිරීම් | - | - | 1,469,916 | 1,469,916 | 1,143,557 |
| | 5,253,887 | 1,835,218 | 18,239,759 | 25,328,864 | 29,431,910 |
| අඩු කළා : | | | | | |
| තොග පාඩුවීම් | - | - | 3,185 | 3,185 | 863 |
| මාරු කිරීම් | - | - | - | - | - |
| 2013.12.31 අවසන් තොගය | 5,253,887 | 1,824,580 | 10,905,341 | 17,983,808 | 23,858,947 |
| | - | 10,638 | 7,331,233 | 7,341,871 | 5,572,100 |

දීර්ඝ සටහන් සඳහා ( 4- ඒ ) , ( 4-බී) සහ ( 4- සී ) සටහන් බලන්න.

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2014.12.31 දිනට අවසන් වර්ෂයේ**
**ආදායම් ප්‍රකාශන සඳහා සටහන්**

**(04 - A)** **විකුණුම් පිරිවැය**

| | තොගය 2014.01.01 | මිලදී ගැනීම් | එකතුව | තොගය 2014.12.31 | ක්ෂයවීම් | ප්‍රචාරණය | මුළු පිරිවැය | වැඩිවීම | බෙදාහැරීමේ ලැබීම් | මුළු ලැබීම් | ලාභය / අලාභය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **එළිය කැවූ චිත්‍රපට** | | | | | | | | | | | |
| දේශීය | 3 | - | 3 | - | - | - | - | 661 | 9,193 | 9,854 | 9,854 |
| බටහිර | 244 | - | 244 | - | - | - | - | - | - | - | - |
| පෙරදිග | 471 | - | 471 | - | - | - | - | - | - | - | - |
| | 718 | - | 718 | - | - | - | - | 661 | 9,193 | 9,854 | 9,854 |
| **මුදා නොහල චිත්‍රපට** | | | | | | | | | | | |
| දේශීය | 3,043,931 | - | 3,043,931 | - | - | - | - | - | - | - | - |
| බටහිර | 982,492 | - | 982,492 | - | - | - | - | - | - | - | - |
| පෙරදිග | 8 | - | 8 | - | - | - | - | - | - | - | - |
| එකතුව | 4,026,431 | - | 4,026,431 | - | - | - | - | - | - | - | - |
| | 4,027,149 | - | 4,027,149 | - | - | - | - | 661 | 9,193 | 9,854 | 9,854 |

| | | | 2014 | | 2013 |
|---|---|---|---|---|---|
| | | | රු. | | රු. |
| **තොගය 2014.01.01** | | | - | | - |
| එකතු කළා : | මිලදී ගැනීම් | | - | | - |
| | ප්‍රචාරණය | | - | | - |
| | | | - | | - |
| අඩු කළා : | තොගය 2014.12.31 | | - | | - |
| | පිරිවැය | | - | | - |
| එකතු කළා: | අනෙකුත් චිත්‍රපට | | | | |
| **තොගය 2014.01.01** | | | | | |
| I. ප්‍රතිශත පදනම මත | | 259,890 | | 259,890 | |
| II. සිනේ සිත්තම් | | 966,848 | 1,226,738 | 966,848 | 1,226,738 |
| එකතු කළා : | වියදම් | | - | | - |
| | | | 1,226,738 | | 1,226,738 |
| අඩු කළා : | මාරු කිරීම් | | | | |
| **තොගය 2014.12.31** | | | | | |
| I. ප්‍රතිශත පදනම මත | | 259,890 | - | - | - |
| II. සිනේ සිත්තම් | | 966,848 | 1,226,738 | - | 1,226,738 |
| **මුළු පිරිවැය** | | | - | - | - |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2014.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**(04 - B)** විකුණුම් පිරිවැය

| | දළ සේයාපට | සිනමා කාබන් | අමතර කොටස් | රසායන ද්‍රව්‍යය | ලිපි ද්‍රව්‍යය | එකතුව 2014 | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආරම්භක තොගය 2014.01.01 | 287,951 | 2,811,898 | 11,460,514 | - | 2,209,479 | 16,769,843 | 20,315,073 |
| එකතු කළා : | | | | | | | |
| මිලදී ගැනීම් | - | - | - | - | 1,469,916 | 1,469,916 | 1,131,857 |
| | 287,951 | 2,811,898 | 11,460,514 | - | 3,679,395 | 18,239,759 | 21,446,930 |
| අඩු කළා : | | | | | | | |
| තොග හානිවීම | - | 2,789 | - | - | 396 | 3,185 | - |
| 2014.12.31 අවසන් තොගය | 287,951 | 2,130,804 | 6,072,666 | - | 2,413,920 | 10,905,341 | 16,769,842 |
| | - | 678,305 | 5,387,848 | - | 1,265,079 | 7,331,233 | 4,677,088 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2014.12.31 දිනට අවසන් වර්ෂයේ**
**ආදායම් ප්‍රකාශන සඳහා සටහන් ( චිත්‍රාගාරය )**

**(04 - C) විකුණුම් පිරිවැය**

| | දළ සේයාපට | සිනමා කාබන් | අමතර කොටස් | රසායන ද්‍රව්‍යය | එකතුව 2014 | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ආරම්භක තොගය | 816,569 | - | 964,559 | 54,090 | 1,835,218 | 2,719,393 |
| 2013.01.01 | | | | | | |
| මිලදී ගැනීම් | - | - | - | - | - | 11,700 |
| | 816,569 | - | 964,559 | 54,090 | 1,835,218 | 2,731,093 |
| අඩු කළා : | | | | | | |
| තොග හානිවීම | - | - | - | - | - | 863 |
| මාරු කිරීම් | - | - | - | - | - | - |
| 2013.12.31 අවසන් තොගය | 816,569 | - | 953,921 | 54,090 | 1,824,580 | 1,835,218 |
| වර්ෂය තුළ අභ්‍යන්තර පාවිච්චිය | - | - | 10,638 | - | 10,638 | 895,012 |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2014.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

සටහන : 05

| | ප්‍රදර්ශන | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් | එකතුව 2014 | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **සේවක පාරිශ්‍රමිකය** | | | | | | |
| වැටුප් හා වේතන | 5,124,705 | 3,931,214 | 1,673,147 | 19,047,883 | 29,776,949 | 31,690,586 |
| අතිකාල , නිවාඩු පඩි හා වන්දි | 603,942 | 1,185,231 | 257,333 | 1,600,436 | 3,646,942 | 4,101,000 |
| සේවක අර්ථසාධක හා භාරකාර අරමුදලට දායක මුදල් | 823,809 | 586,319 | 229,092 | 2,662,013 | 4,301,233 | 4,549,314 |
| වෙනත් දීමනා | 3,969,547 | 2,806,396 | 956,387 | 16,932,783 | 24,665,113 | 19,374,004 |
| | **10,522,003** | **8,509,160** | **3,115,959** | **40,243,115** | **62,390,237** | **59,714,904** |

සටහන : 06

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ගමන් හා යැපීම් දීමනා** | | | | | | |
| ගමන් වියදම් ( දේශීය ) | 4,195 | 4,638 | - | 128,003 | 136,836 | 82,227 |
| ( විදේශීය ) | - | - | - | 344,551 | 344,551 | 161,001 |
| යැපීම් දීමනා | 7,675 | 6,425 | 22,990 | 289,678 | 326,768 | 320,424 |
| | **11,870** | **11,063** | **22,990** | **762,232** | **808,155** | **563,652** |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2014.12.31 දිනට අවසන් වර්ෂයේ**
**ආදායම් ප්‍රකාශන සඳහා සටහන්**

සටහන : 07

| | ප්‍රදර්ශණ | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් | එකතුව 2014 | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **සැපයුම් හා උපකරණ** | | | | | | |
| ලිපි ද්‍රව්‍යය හා කාර්යාලීය උපකරණ | 5,080 | 17,160 | 48,455 | 1,369,125 | 1,439,820 | 1,727,207 |
| විදුලිය | - | 832,456 | - | 4,239,943 | 5,072,399 | 5,458,057 |
| සංග්‍රහ වියදම් | 18,000 | 8,000 | 9,398 | 428,927 | 464,325 | 204,546 |
| යාන්ත්‍රික හා විදුලි උපකරණ | - | 3,910 | - | 47,902 | 51,812 | 410,812 |
| | 23,080 | 861,526 | 57,853 | 6,085,897 | 7,028,356 | 7,800,622 |

සටහන : 08

| | ප්‍රදර්ශණ | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් | එකතුව 2014 | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|
| **අළුත්වැඩියා කිරීම් , නඩත්තු හා ක්ෂයවීම්** | | | | | | |
| ඉන්ධන හා ලිහිසි තෙල් | - | - | - | 1,451,673 | 1,451,673 | 4,663,510 |
| නඩත්තු | - | 121,713 | - | 7,152,113 | 7,273,826 | 4,491,593 |
| ක්ෂයවීම් | - | 5,502,748 | - | 15,259,494 | 20,762,242 | 17,780,018 |
| | - | 5,624,461 | - | 23,863,280 | 29,487,741 | 26,935,121 |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2014.12.31 දිනට අවසන් වර්ෂයේ
## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**සටහන : 09**

| | ප්‍රදර්ශන | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් | එකතුව 2014 | එකතුව 2013 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ප්‍රවාහන , සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවාවන් | | | | | | |
| ප්‍රවාහනය | - | - | - | 910,050 | 910,050 | 270,554 |
| සම්බන්ධතා | 66,480 | 54,330 | 38,443 | 1,534,492 | 1,693,745 | 1,596,048 |
| අවශ්‍යතා | 32,672 | 113,526 | 79,334 | 3,418,481 | 3,644,013 | 4,312,076 |
| වරිපනම් බදු | - | - | - | 784,889 | 784,889 | 804,239 |
| වෙනත් සේවා | 60,375 | 1,397,563 | 1,354,479 | 8,439,427 | 11,251,844 | 10,098,562 |
| කපා හැරීම් -තැන්පතු සහ අනෙකුත් ලැබීම් | - | - | - | - | - | 133,840 |
| සේවක ණය පොලී පිරිවැය | - | - | - | 1,182,551 | 1,182,551 | 1,294,968 |
| (-) සේවක ණය පොලී ආදායම | - | - | - | (1,182,551) | (1,182,551) | (1,294,968) |
| නිෂ්පාදන ණය පොලී කපා හැරීම් | - | - | - | 211,878 | 211,878 | 68,608 |
| | 159,527 | 1,565,419 | 1,472,256 | 15,299,217 | 18,496,419 | 17,283,927 |

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

## 2014.12.31 දිනට අවසන් වර්ෂයේ

## ආදායම් ප්‍රකාශන සඳහා සටහන්

**සටහන : 10**

**වෙනත් ආදායම්**

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| නිෂ්පාදන ණය පොලී | 4,767,640 | 4,007,480 |
| සේවක ණය පොලී | 420,908 | 466,189 |
| විවිධ ආදායම් | 1,782,712 | 1,934,157 |
| පිටස්තර රූගත කිරීම් | 2,849,245 | 2,504,728 |
| සංස්ථාවට අයත් නොවන චිත්‍රපට අළුත්වැඩියා කිරීම් සඳහා | 1,961,046 | 2,428,726 |
| ස්ථාවර හා භාණ්ඩාගාර බිල්පත් පොලී | 10,267,443 | 11,787,366 |
| අයදුම්පත් ගාස්තු | 212,000 | 263,328 |
| එන්. එෆ්. සී. සිනමාහලේ ආදායම | 3,315,000 | 2,178,450 |
| රක්ෂණ සංස්ථාවෙන් වන්දි ලැබීම් | - | 34,050 |
| චිත්‍රපට නැරඹීම සඳහා ලැබීම් | 8,000 | 7,000 |
| තිරනාටක සඳහා අනුමැතිය | 15,000 | 5,000 |
| 224 ගොඩනැගිලි කුලී ආදායම | 7,740,000 | 3,120,000 |
| පාඨමාලාවන් සඳහා ලැබීම් | 294,600 | 716,900 |
| ප්‍රක්ෂේපණ යන්ත්‍ර ලබා දීම | 200,000 | 2,000,000 |
| භාණ්ඩාගාර ලැබීම් ආදායමට හඳුනා ගැනීම් | 19,300,177 | 13,898,558 |
| නොගෙවිය යුතු වැටුප් අත්තිකාරම් ආදායමට හඳුනා ගැනීම | - | 33,747 |
| ණය හිමියන් සඳහා වෙන් කිරීම් | - | 4,193 |
| හිමිකම් නොපෑවේතන ආදායමට හඳුනා ගැනීම් | - | 272,679 |
| වාහන ඉවත් කිරීමේ ගිණුම | 2,611,420 | - |
| | 55,745,191 | 45,662,551 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2014 දෙසැම්බර් 31 දිනට**
**මුල්‍ය තත්ත්වය සඳහා සටහන්**

**සටහන : 11 - ස්ථාවර වත්කම්**

| දේපල , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | | පිරිවැය | වර්ෂය තුල එකතු කිරීම් | වර්ෂය තුල ඉවත් කිරීම් | පිරිවැය | සමුච්චිත ක්ෂයවීම් | වර්ෂය සඳහා ක්ෂයවීම් | සමුච්චිත ක්ෂයවීම් | ශුද්ධ අගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2014.01.01 | | | 2014.12.31 | 2014.01.01 | | | 2014.12.31 |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ඒ. | **01.** සින්නක්කර ඉඩම් | 174,343,458 | - | - | 174,343,458 | - | - | - | 174,343,458 |
| | **02.** සින්නක්කර ගොඩනැගිලි | 114,547,735 | 4,279,061 | - | 118,826,796 | 33,694,043 | 5,082,107 | 38,776,150 | 80,050,646 |
| | **03.** තාවකාලික ගොඩනැගිලි | 6,080,387 | - | - | 6,080,387 | 6,080,386 | - | 6,080,386 | 1 |
| | **04.** සිනමා සංකීර්ණය | 104,928,508 | - | - | 104,928,508 | 35,101,360 | 7,061,919 | 42,163,279 | 62,765,230 |
| | **05.** මිනි සිනමා උපකරණ | 331,451 | - | - | 331,451 | 331,449 | - | 331,449 | 2 |
| | **06.** ලී බඩු , සවි කිරීම් හා වැද්දුම් | 16,192,347 | 276,000 | - | 16,468,347 | 14,838,930 | 301,915 | 15,140,845 | 1,327,502 |
| | **07.** කාර්යාලීය උපකරණ | 16,404,749 | 214,380 | - | 16,619,129 | 12,783,723 | 666,549 | 13,450,272 | 3,168,856 |
| | **08.** මෝටර් රථ | 15,612,932 | 7,381,429 | 7,696,541 | 15,297,820 | 7,916,383 | 1,845,357 | 9,761,740 | 5,536,080 |
| | **09.** චිත්‍රපට සංරක්ෂණය | 1,610,655 | - | - | 1,610,655 | 770,529 | 97,279 | 867,808 | 742,847 |
| | **10.** පාපැදි | 18,281 | - | - | 18,281 | 18,277 | - | 18,277 | 4 |
| | **11.** චිත්‍රපට උපකරණ | 910,689 | - | - | 910,689 | 516,430 | 49,280 | 565,710 | 344,979 |
| | **12.** ප්‍රක්ෂේපණ උපකරණ | 480,202 | - | - | 480,202 | 412,794 | 34,809 | 447,603 | 32,599 |
| | **13.** චිත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර | 88,594,819 | 218,764 | - | 88,813,583 | 56,485,907 | 5,502,748 | 61,988,655 | 26,824,928 |
| | **14.** සිනමා අධ්‍යාපන උපකරණ | 1,241,350 | - | - | 1,241,350 | 540,649 | 120,279 | 660,928 | 580,422 |
| | **15.** සුහසාධන උපකරන | 194,961 | - | - | 194,961 | 194,960 | - | 194,960 | 1 |
| | | 541,492,524 | 12,369,634 | 7,696,541 | 546,165,617 | 169,685,820 | 20,762,242 | 190,448,062 | 355,717,555 |
| බී. | එකතු කළා :- | | | | | | | | |
| | නොනිමි ප්‍රාග්ධන කාර්‍යයන් | | | | | | | | |
| | **01.** ප්‍රධාන කාර්යාලය ගොඩනැගිල්ල | - | - | - | - | - | - | - | - |
| | **02.** චිත්‍රාගාරය - ගොඩනැගිල්ල | 10,307,692 | 2,776,566 | - | 13,084,258 | - | - | - | 13,084,258 |
| | | 10,307,692 | 2,776,566 | - | 13,084,258 | - | - | - | 13,084,258 |
| | එකතුව | 551,800,216 | 15,146,200 | 7,696,541 | 559,249,875 | 169,685,820 | 20,762,242 | 190,448,062 | 368,801,813 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2014 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

| | 2014 රු. | 2013 රු. |
|---|---|---|
| සටහන : 12 | | |
| දිගු කාලීන ආයෝජන | | |
| සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | 127,000 | 127,000 |
| | 127,000 | 127,000 |
| සටහන : 13 | | |
| කෙටි කාලීන ආයෝජන | | |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැන්පතු සේවක | 5,000 | 5,000 |
| ස්ථාවර තැන්පතු | 15,955,241 | 14,616,424 |
| රිපෝ තැන්පතු | 83,977,782 | 33,700,000 |
| භාණ්ඩාගාර බිල්පත් | 81,341,342 | 76,477,060 |
| | 181,279,365 | 124,798,484 |
| සටහන : 14 | | |
| තොග | | |
| චිත්‍රපට | 5,253,887 | 5,253,886 |
| වෙළඳ කටයුතු | 10,905,341 | 17,596,852 |
| චිත්‍රාගාරය | 1,824,580 | 1,008,209 |
| චිත්‍රාගාරය නඩත්තු අමතර කොටස් | 1,472,575 | 1,472,576 |
| ලිපි ද්‍රව්‍යය හා වෙනත් | 1,050,204 | 1,041,843 |
| | 20,506,587 | 26,373,366 |
| සෙමින් අලෙවි වන සහ අලෙවි නොවන තොග සඳහා වෙන් කිරීම් | (8,597,176) | (13,193,244) |
| | 11,909,411 | 13,180,122 |
| සටහන : 15 | | |
| ණයගැතියෝ | | |
| සිනමාහල් | 141,370,156 | 156,164,056 |
| නිෂ්පාදකයෝ | 114,694,335 | 113,311,542 |
| | 256,064,491 | 269,475,598 |
| අඩු කළා :- | | |
| ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම( සටහන 15 ඒ ) | (132,928,299) | (128,835,649) |
| | 123,136,192 | 140,639,949 |
| සටහන : 16 | | |
| විවිධ ණයගැතියෝ | | |
| වෙනත් | 130,126,139 | 6,849,777 |
| විවිධ ණයගැතියෝ සඳහා හානිකරන ගැලපීම( සටහන 15 ඒ ) | - | (342,489) |
| සේවක අත්තිකාරම් | 19,346,196 | 20,451,050 |
| සේවක ණය වත්කම් ගිණුම | 7,634,829 | 5,429,648 |
| (-) සේවක ණය වගකීම් ගිණුම | (7,634,829) | (5,429,648) |
| | 149,472,335 | 26,958,338 |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2014 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

**බොල් ණය සඳහා වෙන් කිරීම් උපලේඛනය**

සටහන : 15 ඒ

| ණයගැතියෝ | එකතුව 2014 | එකඟ නොවූ හා අය කර ගත නොහැකි | අය කර ගත හැකි | 5% වෙන් කිරීම් | මුළු වෙන් කිරීම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| සිනමාහල් | 141,370,156 | 65,938,408 | 75,431,748 | 3,771,500 | 69,709,908 |
| නිෂ්පාදකයන් | 114,694,335 | 60,148,702 | 54,545,633 | 2,727,200 | 62,875,902 |
| වෙනත් | 130,126,137 | - | 130,126,137 | - | - |
| සේවක අත්තිකාරම් | 19,346,195 | - | 19,346,195 | - | - |
| | 405,536,823 | 126,087,110 | 279,449,713 | 6,498,700 | 132,585,810 |

| | එකතුව | සිනමාහල් | නිෂ්පාදන | වෙනත් | සේවක අත්තිකාරම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ශේෂය ඉ / ගෙ | 129,178,138 | 70,272,351 | 58,563,298 | 342,489 | - |
| බොල් ණය කපා හැරීම් | - | - | - | - | - |
| ලාභාලාභ ගිණුමට මාරු කළා | 3,750,161 | (562,443) | 4,312,604 | - | - |
| | 132,928,299 | 69,709,908 | 62,875,902 | 342,489 | - |

ණයගැතියන් සඳහා හානිකරන ගැලපීම්

| | |
|---|---|
| 2014.01.01 දිනට | 129,178,138 |
| ලාභාලාභ ගිණුමට මාරු කළා | 3,750,161 |
| ශේෂය ප / ගෙ 2014.12.31 | 132,928,299 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2014 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය සඳහා සටහන්**

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| සටහන : 17 | | |
| තැන්පතු හා ඉදිරියට ගෙවීම් | | |
| තැන්පතු | 6,371,892 | 3,802,115 |
| අත්තිකාරම් ගෙවීම් | 5,132,069 | 7,828,776 |
| සුභසාධක සංගමයට අත්තිකාරම් ගෙවීම් | 10,000 | 19,600 |
| | 11,513,961 | 11,650,491 |
| නොලැබිය හැකි ණය සඳහා හානිකරන ගැලපීම | (703,208) | (981,870) |
| | 10,810,753 | 10,668,621 |
| සටහන : 18 | | |
| මුදල් හා බැංකු ශේෂ | | |
| මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-1-0208647 | 294,980 | 6,674,448 |
| මහජන බැංකුව - ජ. ගි. අ. 055-1-001-5-0667533 | 502,730 | 988,346 |
| මහජන බැංකුව - ජ. ගි. අ. 004-1-001-6-0208664 | 1,064,374 | 3,495,581 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323272 | 2,496,651 | 3,051,588 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323131 | 276,439 | 1,625,803 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323354 | 8,442,131 | 8,624,429 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0002323363 | 8,444,520 | 4,646,051 |
| ලංකා බැංකුව - ජ. ගි. අ. 0005002189 | 25,073 | 908,866 |
| | 21,546,898 | 30,015,112 |
| අත ඉතිරි මුදල් | | |
| සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය | 27,876 | 50,000 |
| සුළු මුදල් - චිත්‍රාගාරය | 4,153 | 10,014 |
| සුළු මුදල් - චිත්‍රපට ගබඩාව | 34 | 34 |
| | 32,063 | 60,048 |
| එකතුව | 21,578,961 | 30,075,160 |
| සටහන : 19 | | |
| ප්‍රදානයන් | | |
| භාණ්ඩාගාර ප්‍රදානයන් | 156,162,990 | 418,400,000 |
| (-)ක්‍රමක්ෂය | 19,300,177 | 280,337,010 |
| | **136,862,813** | **138,062,990** |

## ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
## 2014 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය සඳහා සටහන්

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| සටහන : 20 | | |
| ඉදිරියට ගෙනා ශේෂය - 2014.01.01 | 32,225,488 | 33,885,924 |
| වර්ෂය සඳහා වෙන් කිරීම් | 4,005,290 | 2,725,863 |
| මුදල් ගෙවීම් | (2,169,965) | (4,386,297) |
| | 34,060,813 | 32,225,490 |
| (භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර ඇත.) | | |

| | | |
|---|---|---|
| සටහන : 21 | | |
| තැන්පතු | | |
| එන්.එෆ්.සී. සිනමාශාලා ඇප තැන්පතු | 90,000 | 60,000 |
| ආපනශාලා තැන්පතු | 10,000 | 10,000 |
| ආරක්ෂක තැන්පතු - සිනමාශාලා | 2,326,727 | 2,326,727 |
| සේවක | 5,000 | 5,000 |
| චිත්‍රපට ආනයන | 7,500 | - |
| සිනමා ව්‍යාපෘතිය | 45,000 | 45,000 |
| | 2,484,227 | 2,446,727 |

| | | |
|---|---|---|
| සටහන : 22 | | |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | | |
| චිත්‍රපට කුලී ණයහිමියෝ | 226,657,603 | 123,977,635 |
| (-) ණයහිමියන් සඳහා හානිකරන ගැලපීම | (18,046,804) | (18,046,795) |
| | 208,610,799 | 105,930,840 |

<u>ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව</u>

<u>2014 දෙසැම්බර් 31 දිනට</u>

<u>මූල්‍ය තත්ත්වය සඳහා සටහන්</u>

<u>සටහන : 23</u>

**<u>වෙනත් ණයහිමියෝ</u>**

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| උපචිත වියදම් | 6,434,329 | 8,493,415 |
| ගෙවිය යුතු එකතු කල අගය මත බද්ද | 152,613 | 164,359 |
| විගණන ගාස්තු ප්‍රතිපාදන | 986,720 | 900,000 |
| දේශීය ආදායම් කොමසාරිස් (මුද්දර) | 44,380 | 26,630 |
| චිත්‍රපට කලාකරුවන් හා කාර්මික ශිල්පීන්ගේ අරමුදල | - | 92,228 |
| හිමිකම් නොපෑවේතන | 889,824 | 887,586 |
| සේවක අර්ථසාධක අරමුදල | 665,928 | 613,617 |
| සේවක භාරකාර අරමුදල | 74,209 | 67,076 |
| විවිධ ණයහිමියෝ | 1,518,910 | 2,453,541 |
| (-) නොගෙවිය යුතු වගකීම් සඳහා වෙන් කිරීම් | (644,840) | (644,840) |
| විවිධ ණයගැතියෝ (බැර ශේෂය) | 1,257,674 | 1,927,407 |
| චිත්‍රපට කුලී ණයගැතියෝ | 3,704,237 | 3,249,734 |
| මහා භාණ්ඩාගාරය | 5,000,000 | 5,000,000 |
| ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල | 3,569,113 | 3,547,454 |
| රිත්මා මණ්ඩල පාලන ගිණුම | 2,078,307 | 2,265,568 |
| සිනේ තරු පුංචි තාරකා | 31,750 | 31,750 |
| චිත්‍රපට උත්සව සඳහා වෙන් කිරීම් ගිණුම | 5,000,000 | 5,000,000 |
| උපයන විට බද්ද ගෙවීම | 25,577 | 11,677 |
| වැටුප් හා වේතන වෙන් කිරීමේ ගිණුම | 714,182 | 714,182 |
| ලැබිය යුතු නිෂ්පාදන ණය පොලී වෙන් කිරීම | 5,381,452 | 3,132,217 |
| | **36,884,365** | **37,933,601** |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2014 දෙසැම්බර් 31 දිනට**

**ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්**

| වෙනත් සේවා | එකතුව 2014 | ප්‍රදර්ශන | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| අධ්‍යක්ෂක ගාස්තු | 345,600 | - | - | - | 345,600 |
| ප්‍රචාරණය | 2,010,455 | - | - | - | 2,010,455 |
| විශේෂ කොමිෂන් ගාස්තු | 86,400 | - | - | - | 86,400 |
| නීති ගාස්තු | 675,757 | - | - | - | 675,757 |
| සංස්ථා උලෙලයන් | 440,644 | - | - | - | 440,644 |
| විගණන ගාස්තු | 500,000 | - | - | - | 500,000 |
| ආරක්ෂක සේවා | 4,743,135 | - | 1,397,563 | - | 3,345,572 |
| බැංකු ගාස්තු | 19,290 | - | - | - | 19,290 |
| විවිධ වියදම් | 103,571 | - | - | - | 103,571 |
| සිනමා අධ්‍යාපන | 907,116 | - | - | 907,116 | - |
| පිටස්තර මරණාධාර හා සිනමා ශිල්පීය වියදම් | 877,494 | - | - | - | 877,494 |
| නව සිනමාහලේ වියදම් | 60,375 | 60,375 | - | - | - |
| දැයට කිරුළ වැඩසටහන | 447,363 | - | - | 447,363 | - |
| විනිමය අනුපාත ගැලපීම | 17,450 | - | - | - | 17,450 |
| තිර නාටක කියවීම | 11,000 | - | - | - | 11,000 |
| චිත්‍රපට නැරඹීම | 4,500 | - | - | - | 4,500 |
| ප්‍රමාද ගාස්තු | 1,694 | - | - | - | 1,694 |
| | 11,251,844 | 60,375 | 1,397,563 | 1,354,479 | 8,439,427 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**

**2014 දෙසැම්බර් 31 දිනට**

**ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්**

| | එකතුව 2014 | ප්‍රදර්ශන | චිත්‍රාගාරය | නිෂ්පාදන | පොදු පරිපාලන වියදම් |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ප්‍රවාහනය | 910,050 | - | - | - | 910,050 |
| සම්බන්ධතා | 1,693,745 | 66,480 | 54,330 | 38,443 | 1,534,492 |
| <u>අවශ්‍යතා</u> | | | | | |
| අභ්‍යන්තර පාවිච්චිය | 223,484 | 12,004 | 4,950 | 54,334 | 152,196 |
| විදේශීය චිත්‍රපට උළෙල | 22,000 | - | - | 22,000 | - |
| සුභසාධක වියදම් | 2,909,410 | 20,668 | 108,576 | 3,000 | 2,777,166 |
| සේවක බඳවා ගැනීම් හා පුහුණුව | 121,790 | - | - | - | 121,790 |
| ජල බිල්පත් | 367,329 | - | - | - | 367,329 |
| | 3,644,013 | 32,672 | 113,526 | 79,334 | 3,418,481 |
| වරිපනම් බදු | 784,889 | - | 582,504 | - | 202,385 |

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
**2014 දෙසැම්බර් 31 දිනට**
**මුල්‍ය තත්ත්වය සඳහා සටහන්**

**සටහන : 24**
**අධ්‍යක්ෂක මණ්ඩල සබදතා**

ආයතනයේ මුල්‍ය හා මෙහෙයුම් තීරණ වලට බලපෑම් සිදු කළ හැකි කිසිදු ගණුදෙනුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කර නොමැත. 2015 වසරේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් පහත දක්වා ඇත.

| අංකය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම | පත් කල දිනය | දරන තනතුර හා සේවා ස්ථානය / ලිපිනය | ලිපිනය | සම්බන්ධිත පාර්ශවයන්ගේ ගණුදෙනුවේ ස්වභාවය |
|---|---|---|---|---|---|
| 1 | නීතිඥ දීපාල් චන්ද්‍රරත්න මහතා | 2015.03.11 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති සභාපති - ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව | සභාපති , ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව. කොළඹ 07. | - |
| 2 | එස්. කේ. එම්. ඩී. දර්ශනී ගුණතිලක මහත්මිය | 2015.05.14 | අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික ( නිල බලයෙන් ) ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂක , රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, කොළඹ 05. | - |
| 3 | එන්. ගොඩකන්ද මහත්මිය | 2015.03.26 | භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂ ජනරාල් - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | අධ්‍යක්ෂ ජනරාල් , මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය , කොළඹ 01. | - |
| 4 | නයන හෙට්ටිආරච්චි මහතා | 2015.04.06 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක.330/8 , සමන් මාවත , වැවපාර , බොරලැස්ගමුව. | - |
| 5 | පී. වී. පි. දයාරත්න මහත්මිය | 2015.02.06 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක. 59/3 , හීනටිකුඹුර , තලංගම උතුර , බත්තරමුල්ල. | - |
| 6 | ආචාර්ය අනිල් සමරනායක මහතා | 2015.05.14 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක. 182/1 , හිල් විදිය , දෙහිවල | |
| 7 | අමල් අල්විස් මහතා | 2015.05.14 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අංක 262, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත බත්තරමුල්ල | |

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ටීඑම්/ඊ/එන්එෆ්සී/<br>1/14/62 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2015 ඔක්තෝබර් 16 දින |

සභාපති,

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2 )(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 31(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත ඉදිරියේදී නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය ව්‍යාවනය

මම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ට අනුව ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ පෙර වර්ෂයට අදාලව සිදුකරන ලද වැරදි නිවැරදි කිරීම සංසන්දනාත්මක තොරතුරු වෙනස් කිරීම් ලෙස මූල්‍ය වාර්තාවල අනාවරණය කළයුතු නමුත් පෙර වර්ෂයට අදාලව සිදුකර තිබුණු රු. 4,596,068 ක නිවැරදි කිරීම් එලෙස අනාවරණය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 ට අනුව සම්පූර්ණයෙන් ක්ෂය කළ එහෙත් දැනට මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන වත්කම් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් මස මිලට ගෙන තිබුණු මෝටර් රථයක් වෙනුවෙන් මෝටර් රථය මිලදීගත් දිනය නොසලකා වර්ෂය සඳහාම ක්ෂයකර තිබීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය වියදම රු. 1,638,070 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 ප්‍රකාරව පාරිතෝෂික ගණනය කිරීම් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 40 ට අනුව ආයෝජන වත්කම් හඳුනාගෙන ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සංස්ථාවේ තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම් දෙකින් අවම අගයට තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බව අනාවරණය කර තිබුණද භාවිතයට ගත නොහැකි තොගවල අගය අඩුවීම් වෙනුවෙන් සිදුකර තිබුණු වෙන්කිරීම් සිදුකළ පදනම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම්කරණ පද්ධතිය තුළ දක්නට ලැබෙන දුර්වලතා හේතුවෙන් විෂයයන් 04 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් හා ලෙජර ගිණුම අනුව වූ ශේෂයන් අතර රු. 92,359,122 ක වෙනසක් නිරීක්ෂණය වූයෙන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය හා තුල්‍යතාවය විගණනයේදී තහවුරුකර ගැනීම ප්‍රශ්නකාරී විය.

(ආ) අනතුරට පත්වීමෙන් ගර්හිත තත්ත්වයට පත්ව තිබුණු වාහනයක් වෙනුවෙන් රක්ෂණ වන්දි ලැබීම හා ඒ වෙනුවෙන් වූ කල්බදු වගකීම නිරවුල් කිරීම සම්බන්ධයෙන් ගිණුම් තැබීමේදී වූ දෝෂ හේතුවෙන් වාහන ඉවත් කිරීමේ ලාභය රු. 127,655 ක් වැඩියෙන් දක්වා තිබූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රක්ෂණ වන්දි ලෙස ලද මුදල රු. 763,596 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ලෙජර ගිණුම් අනුව විවිධ ණයහිමි පාලන ගිණුම් බැර ශේෂය රු.815,777 ක් වූ නමුත් උපලේඛන බැර ශේෂය වූ රු. 1,518,910 ක් විවිධ ණයහිමියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට චිත්‍රාගාරයේ නොනිමි ප්‍රාග්ධන කාර්යයන් ලෙස රු.13,084,258 ක් දක්වා තිබුණද මෙම වටිනාකම තුළ ඇතුළත් දැනට නිමකරන ලද කාර්යයන් හඳුනාගෙන වත්කම් ගිණුම්වලට ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2011 වර්ෂයේදී කඩා ඉවත්කර තිබූ පිරිවැය රු. 6,080,387 ක්වූ තාවකාලික ගොඩනැගිල්ලක වටිනාකම හා අදාල ක්ෂය ප්‍රමාණයන් ගිණුම්වලින් හා ලේඛනවලින් ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සිනමාශාලා නවීකරණය යටතේ සිනමාශාලාවක් සඳහා ණය පදනම යටතේ ලබාදුන් රු.1,355,007 ක්වූ ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් ණය නොගෙවීම නිසා ආපසු ලබාගෙන තිබුණි. එසේ වුවත් එම උපකරණ වටිනාකම සිනමාශාලා ණයගැතියන්ගෙන් අඩුකර තොගයට ඇතුලත් කර නොතිබුණි.

## 2.2.4 නොසැසඳූ පාලන ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලෙජරයට අනුව චිත්‍රපට කුලී ණයහිමියන් සහ චිත්‍රපට කුලී ණයගැති ගිණුම්වල ශේෂ හා විගණනයට ඉදිරිපත් කළ උපලේඛන අතර රු. 25,839,838 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) අන්තර් දෙපාර්තමේන්තු ගනුදෙනු සටහන් කරනු ලබන ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට පැවති බැර ශේෂය රු. 28,801,861 ක් විය. එසේ වුවත් ඊට අනුරූපීව පවත්වාගෙන යනු ලබන චිත්‍රපට බෙදාහැරීමේ මණ්ඩල ගිණුමේ එදිනට පැවති ශේෂය රු. 2,078,307 ක් වුවද මෙකී ජංගම ගිණුම් ශේෂයන් නිවැරදිව හඳුනා ගෙන සැසඳීමට පියවර ගෙන නොතිබුණි.

## 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන් අනුව ප්‍රධාන කාර්යාලයේ අවසන් තොග වටිනාකම රු.4,939,316 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු තොග වටිනාකම රු. 17,209,432 ක් වූයෙන් රු. 12,270,116 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද මූල්‍ය ප්‍රකාශන අනුව සරසවි චිත්‍රාගාරයේ තොග වටිනාකම රු. 3,297,155 ක් වූ අතර භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන්හි අවසන් තොග වටිනාකම් දක්වා නොතිබුණි.

### 2.2. 6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | ගිණුමේ විස්තරය | වටිනාකම | ඉදිරිපත් නොකළ ලිඛිත සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | තැන්පතු හා ඉදිරියට කළ ගෙවීම් | 826,228 | ලදුපත් |
| (ආ) | ණයගැතියෝ - වෙනත් | 130,126,137 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (ඇ) | හිමිකම් නොපෑ වේතන | 387, 231 | විස්තරාත්මක උපලේඛන |
| (ඈ) | භාවිතා නොවෙන තොගය | 3,696,883 | - එම - |
| (ඉ) | අධිභාර වෙන්කිරීම (සිනමාශාලා කුළී සඳහා) | 81,190,216 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (ඊ) | ලැබියයුතු මුදල් | 2,571,892 | කාල විශ්ලේෂණ |
| | | 218,798,587 | |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිෂ්පාදන ණයගැතියෝ:

(i) නිෂ්පාදන ණයගැතියන් මුළු වටිනාකම රු. 110,547,570 ක් වූ අතර එයින් වර්ෂ තුනක කාලයක සිට අයකර නොගත් ණයගැතියන් ප්‍රමාණය රු. 8,452,361 ක් හෙවත් සියයට 7 ක් විය. වර්ෂ පහකට වැඩි කාලයක සිට අයකර නොගත් ණයගැතියන් ප්‍රමාණය රු. 60,851,013 ක් හෙවත් සියයට 55 ක් විය. මෙම මුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගත් බවට තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවිණි.

(ii) නිෂ්පාදන ණයගැති පාලන ගිණුම අනුව නිෂ්පාදන ණයගැති ගිණුමේ ශේෂය රු. 109,289,896 ක් වුවද එම ශේෂයට පදනමකින් තොරව එකතුව රු. 14,642,051 ක් වූ හර හා බැර ශේෂයන් ගලපා ශුද්ධ ණයගැති වටිනාකම රු.114,694,335 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ අනුව, මෙකී ණයගැති ශේෂය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) සිනමාහල් ණයගැතියෝ :

(i) 2001 වර්ෂයේ සිනමාශාලාවල චිත්‍රපට බෙදාහැරීම් කටයුතු පෞද්ගලික මණ්ඩලවලට පැවරීමට පෙර සහ පසුව පැවති එහෙත් දැනට වසා දමා ඇති සිනමා ශාලා 265 කින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය රු. 65,339,829 ක් විය.

(ii) දැනට ක්‍රියාත්මක වන මණ්ඩලවලට අයත් සිනමාශාලා 169 කින් අයවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය රු. 152,076,834 ක් විය. සමාලෝචිත වර්ෂයේදීද අයවිය යුතු මුදල් අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි.

(ඇ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සිනමාහල්, නිෂ්පාදන, වෙනත් ණය සහ සේවක අත්තිකාරම් වශයෙන් මුළු ණය එකතුව රු.405,536,823 ක් අයකර ගැනීමට තිබුණි. එසේ වූවත් මෙම ණයගැතියන්ගෙන් රු. 132,928,299 ක් හෙවත් සියයට 33 ක් ආපසු අයකර ගැනීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

(ඈ) විශ්‍රාම ගිය, සේවයෙන් ඉවත් කළ හා සේවය හැරගිය නිලධාරීන් 12 දෙනෙකුට සේවක අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණු රු.672,506 ක් වූ ණය මුදල් වසර 1 ක සිට 11 ක් දක්වා වූ කාලයක් තුළ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) හානිකරණ වටිනාකම අඩුකර ණයගැතියන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බව ගිණුම් සටහන් මඟින් අනාවරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු රු.130,126,137 ක් වූ වෙනත් ණයගැතියන්ගෙන් හානිකරණ වටිනාකම අඩුකර හඳුනාගෙන නොතිබුණි

## 2.4 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1985 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනත හා 2011 සැප්තැම්බර් 28 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 30 | ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු පත්කිරීම සඳහා ප්‍රතිපාදන හෝ තනතුරක් නොමැති වුවද ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු පත්කර රු.45,000 ක මාසික දීමනාවක් , මාසිකව ලීටර 140 ක ඉන්ධන දීමනාවක් හා රියදුරකු සමඟ නිලරථයක් ලබාදී තිබුණු නමුත් අදාළ නිලධාරියා පූර්ණ කාලීනව සේවයේ නිරත නොවු අතර මෙම නිලධාරියාට රාජකාරි ලැයිස්තුවක්ද ලබාදී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙම නිළධාරියා වෙනුවෙන් දරන ලද වැටුප් පිරිවැය රු. 396,000 ක් විය. එසේම සමාලෝචිත වර්ෂයේ අවසන් කාර්තුව සඳහා නව ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු පත්කර තිබූ අතර ඔහුට වැටුප් හා දීමනා වශයෙන් රු. 160,520 ක් ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 110 | පාඩු හා හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීනව හා විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 371 (2) | කාර්යය නිමවූ විගසම අත්තිකාරම් පියවිය යුතු වූවද, වසර 02 වඩා පැරණි එකතුව රු.1,230,747 ක්වූ අත්තිකාරම් ශේෂයන් 07 ක් නිරවුල් කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 756, 757 | වටිනාකම රු.10,379,522 ක් වූ සිනමාශාලා ශබ්ද උපකරණ හා චිත්‍රපට තොගය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. |
| (ඈ) | 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1:3 ඡේදය | ප්‍රවාහන පහසුකම් හිමි නොවන නිලධාරිනියකට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව කාර්යාලය හා නිවාසය අතර යාමට හා ඒමට පෞද්ගලික ප්‍රවාහන පහසුකම් සපයා තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද 2015 ජුලි 20 දින වන විටත් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 2003 මාර්තු 28 දිනැති අංක එම්එෆ්/ටීආර්/1/2003 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය | කුලී වාහනයක් වෙනුවෙන් ගෙවිය හැකි අවම සීමාව ඉක්මවා රු.400,000 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සංස්ථාවේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලය රු. 36,807,353 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය රු. 11,622,173 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 25,185,180 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රදාන හා වෙනත් ආදායම් පිළිවෙළින් රු. 5,040,000 ක් හා රු. 10,082,640 කින් වැඩිවීම හා මෙහෙයුම් අලාභය රු. 10,062,540 කින් අඩුවීම ලාභය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

සංස්ථාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව රු. 14,590,013 ක වන්දි මුදලක් ලබාගැනීම සඳහා නඩු 03 ක් පවරා තිබුණු අතර බාහිර පාර්ශවයන් විසින් සංස්ථාවට එරෙහිව නඩු 12 ක් පවරා තිබුණි. මූල්‍ය ප්‍රකාශනයන්හි මෙකී නඩු කටයුතුවල අසම්භාව්‍ය වගකීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීම් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ නීතිඥ ගාස්තු වශයෙන් රු. 675,757 ක මුදලක් සංස්ථාව විසින් වැයකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය ලබාදීම

චිත්‍රපට සංස්ථා පනතින් සංස්ථාවට පවරා ඇති බලතල ප්‍රකාරව චිත්‍රපට නිෂ්පාදනය කිරීම සඳහා ණය ලබා දීම සංස්ථාවේ ප්‍රධාන කාර්යයක් වන අතර එකී ණය ලබාදීම හා අයකර ගැනීම සම්බන්ධව පහත කරුණු විගණනයේදී නිරීක්ෂණය විය.

(i) ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් නොකළ චිත්‍රපට 26 ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් රු.5,517,719 ක ණය ලබාදී තිබූ අතර වසර 5 ඉක්මවා තිබූ එකී ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු. 4,063,610 ක් හෙවත් සියයට 73 ක ණය මුදල් අයවිය යුතුව තිබුණි.

(ii) ප්‍රදර්ශනය සඳහා මුදාහල චිත්‍රපට 49 ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් රු. 34,235,084 ක ණය ලබාදී තිබූ අතර වසර 5 ඉක්මවා තිබූ එකී ණය මුදලින් රු. 6,216,113 ක් හෙවත් සියයට 18 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතුව තිබුණි.

(iii) ප්‍රදර්ශනය සඳහා මුදාහල චිත්‍රපට 13 ක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් රු. 26,953,489 ක ණය ලබාදී තිබූ අතර වසර 5 කට අඩු එකී ණය මුදලින් රු. 19,524,326 ක් හෙවත් සියයට 72 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතුව තිබුණි.

(iv) ප්‍රදර්ශනය සඳහා මුදා නොහළ එහෙත් වැඩ නිමකළ චිත්‍රපට 08 ක් නිෂ්පාදනය සඳහා ණය ලබාදී වසර 5 කට අඩු වූ රු. 10,732,568 ක සම්පූර්ණ ණය මුදලම සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතුව තිබුණි.

(v) වැඩ නිම නොකළ චිත්‍රපට 12 ක් නිෂ්පාදනය සඳහා ලබා දී තිබූ වසර 5 කට අඩු රු.6,040,720 ක් වූ මුළු ණය මුදලම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයවිය යුතුව තිබුණි.

(ආ) සිනමාශාලා සඳහා ණය ලබාදීම

චිත්‍රපට සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සිනමාශාලා වෙනුවෙන් ණය ලබා දී තිබුණු අතර එම ණය ලබාදීම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේදී සිනමාශාලාවක් නවීකරණය සඳහා රු. 2,033,310 ක ණය මුදලක් ලබාදී තිබුණු අතර එයින් සමාලෝචිත වර්ෂයට අදාළ රු. 243,121 ක ණය වාරික ගෙවීම පැහැරහැර තිබුණි.

(ii) සිනමාශාලා 02 කින් රු. 825,180 ක් ලැබිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු මුදලක් ලැබී නොතිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියමිත දිනට සංස්ථාවට ගෙවා නොමැති චිත්‍රපට කුළී හා සංස්ථා භාරය වෙනුවෙන් අයකළ යුතු සියයට 2.5 ක් වූ අධිභාරය රු. 3,061,887 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේදී මිලදී ගත් රු. 81,250 ක් වටිනා වායුසමීකරණ යන්ත්‍රයක අභ්‍යන්තර කොටස් සමාලෝචිත වර්ෂයේදී අස්ථානගතවී තිබුණු අතර එම අලාභය අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ පරීක්ෂණ අංශය විසින් අනාවරණය කර ගත් අක්‍රමිකතා සඳහා සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද හරපත් 21 කින් අයවිය යුතු රු. 209,280 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පෞද්ගලික බැංකුවක ජංගම ගිණුමක සමාලෝචිත වර්ෂය අවසානයට රු.100,949 ක ශේෂයක් පැවති නමුත් එය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. එසේ වුවද අදහස් දක්වා සභාපතිවරයා මෙම ගිණුම සංස්ථාව නමින් තිබුණද මෙය නළු නිළි සුභසාධන සංගමය සතු ගිණුමක් බව සභාපතිවරයා විසින් අදහස් දක්වා තිබුණි.

**4.4 සෙමින් චලනය වන, නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

සිනමා කර්මාන්තයට උචිත නවීන තාක්ෂණය හඳුන්වාදීම යටතේ සිනමාශාලා සඳහා ණය පදනමින් ලබාදීමට 2011 වර්ෂයේදී මිලදී ගනු ලැබූ සිනමාහල් ශබ්ද උපකරණ වලින් රු. 5,166,792 ක් වටිනා ශබ්ද උපකරණයක් 2015 ජූලි 20 වන විටද සරසවි චිත්‍රාගාරය තුළ නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

**4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති**

2011 වර්ෂයේදී අවසන් කළ යුතු ගිවිසුම්ගත වටිනාකම රු. 13,185,362 ක් වූ ව්‍යාපෘති 03 ක් සමාලෝචිත වර්ෂය වන විටත් අවසන් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එහි ප්‍රමාද කාලය අවුරුදු 03 ක් මාස 05 ක් විය.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ තනතුරු කාණ්ඩ 08 කට අදාලව නිලධාරින් 51 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 30 ක් විය. අනුමත ප්‍රාථමික ශ්‍රේණි ( ශිල්පීය නොවන) කාණ්ඩයේ සේවකයින් 05 දෙනෙකුගේ සහ අනුමත නොකරන ලද වෙනත් තනතුරුවල සේවකයින් 03 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

## 4.7 වාහන පරිභෝජනය

සංස්ථාව සතු වාහන ඇණියෙහි වාහන ගණන 09 ක් වූ අතර එයින් 02 ක් වෙන්කළ වාහන විය. සමාලෝචිත වර්ෂයේදී එම වාහන ධාවනය කළ මුළු දුර ප්‍රමාණය කිලෝ මීටර 82,976 ක්වූ අතර අළුත්වැඩියා සහ නඩත්තු වියදම රු. 1,913,821 ක් හා ඉන්ධන වියදම රු. 1,495,574 ක් විය. ඒ අනුව කිලෝ මීටරයකට වැය කරන ලද අළුත්වැඩියා සහ නඩත්තු හා ඉන්ධන වියදම පිළිවෙලින් රු. 23.06 ක් හා රු. 18.04 ක් විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ දින 114 ක ප්‍රමාදයකින් පසුව 2015 ජුනි 24 දිනදීය.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සාමාන්‍ය පරිපාලන කටයුතු විධිමත් කිරීම සහ චිත්‍රාගාර පහසුකම් වැඩිදියුණු කිරීම හා නවීකරණය යටතේ සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 33 ක් වැයකර ක්‍රියාකාරකම් 9 ක් ආරම්භකර අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, එකී කාර්යයන් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි.

## 5.3 අභ්‍යන්තර විගණනය

සංස්ථාවේ අභ්‍යන්තර විගණන අංශය සඳහා අභ්‍යන්තර විගණක, කළමනාකරණ සහකාර තනතුරු 02 ක් හා කාර්යාල කාර්ය සහයකයෙකු අනුමත කාර්ය මණ්ඩලය අනුව වෙන්කර ඇතත්, අභ්‍යන්තර විගණන අංශය සඳහා අභ්‍යන්තර විගණක හැර අනෙකුත් සහායක කාර්ය මණ්ඩලයක් වර්ෂය පුරාම ලබා දී නොතිබුණි. එම නිසා අභ්‍යන්තර විගණනයේ අරමුණු සාර්ථකව ඉටුකර ගැනීමට හැකි ඉඩ ප්‍රස්ථා සීමාවී තිබුණි.

## 5.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම්, වියදම් සහ තථ්‍ය ආදායම්, වියදම් අතර සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සංස්ථාවේ සභාපතිවරයාට වරින්වර පෙන්වා දෙන ලදී. පහත පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ණය පාලනය

(ආ) ආපසු ගෙවිය යුතු තැන්පතු

(ඇ) ආයෝජන

(ඈ) සුළු මුදල් අත්තිකාරම්

(ඉ) සිනමාශාලා පරීක්ෂණ

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව**
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

**இலங்கைத் தேசியத் திரைப்படக் கூட்டுத்தாபனம்**
பாராளுமன்ற மறுசீரமைப்பு மற்றும் வெகுசன ஊடக அமைச்சு

**National Film Corporation of Sri Lanka**
**Ministry of Parliamentary Reforms & Mass Media**


අංක 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. | දුරකතන - 0112-584623 / 0112-588773 | විද්‍යුත් තැපෑල-filmcorp@sltnet.lk | වෙබ් අඩවිය -www.nfc.gov.lk
இல.303, பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07. | தொலைபேசி-0112-584623 / 0112-588773 | மின்னஞ்சல் புத்குதகுதின்-filmcorp@sltnet.lk | இணையத்தளம்-www.nfc.gov.lk
No.303, Bauddhloka Mawatha, Colombo 07. | Tel - 0112-584623 / 0112-588773 | Email-filmcorp@sltnet.lk | Website-www.nfc.gov.lk